**<u>කැකිරාව ප්‍රාදේශීය සභාවේ 2025.06.26 දින පැවති මහ සභා රැස්වීමේ සංක්ෂිප්ත වාර්තාව</u>**

වර්ෂ 2025 ක් වූ ජුනි මස 26 වන දින පෙ.ව. 10.00 ට ගරු සභාපති සිදත් චාමර බංඩාර මුදියන්සේ මහතාගේ ප්‍රධානත්වයෙන් කැකිරාව ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ දී පැවති මහ සභා රැස්වීමේ වාර්තාවයි. එදින සහභාගී වූවෝ

**<u>සහභාගීවූවෝ</u>**
**<u>ගරු මහජන නියෝජිත මහත්ම/මහත්මීන්,</u>**

| තනතුර | නම |
|---|---|
| **01.** ගරු සභාපති | - සිදත් චාමර බණ්ඩාර මුදියන්සේ මහතා |
| **02.** ගරු උප සභාපති | - L.S.W.K.ඉමදූව මහතා |
| **03.** ගරු සභික | - C.A.H.M.නිමල්සිරි චන්ද්‍රසේකර මහතා |
| **04.** ගරු සභික | - A.D.P.කුමාර අබේසේකර මහතා |
| **05.** ගරු සභික | - B.ආනන්ද ජයරත්න මහතා |
| **06.** ගරු සභික | - J.E.D.ප්‍රියදර්ශණී එදිරිසිංහ මහත්මිය |
| **07.** ගරු සභික | - H.M.චමින්ද කුමාර විජේරත්න මහතා |
| **08.** ගරු සභික | - H.M.කිත්සිරි හේරත් මහතා |
| **09.** ගරු සභික | - S.ජෙගදීසන් මහතා |
| **10.** ගරු සභික | - H.නවරත්න බංඩාර මහතා |
| **11.** ගරු සභික | - B.B.අසංක ජයසූරිය මහතා |
| **12.** ගරු සභික | - A.A.ලයනල් මහතා |
| **13.** ගරු සභික | - G.අනුර බංඩාර මහතා |
| **14.** ගරු සභික | - M.M.කුමාරසිංහ බංඩා මහතා |
| **15.** ගරු සභික | - D.D.විජේසිංහ මහතා |
| **16.** ගරු සභික | - P.G.සන්ත දිසානායක මහතා |
| **17.** ගරු සභික | - I.T.M.C.C.B.පොතුහැර මහතා |
| **18.** ගරු සභික | - M.G.ප්‍රභාත් වීරසේන මහතා |
| **19.** ගරු සභික | - K.සබුරාන් මහතා |
| **20.** ගරු සභික | - D.U.G.N.B.දොඩම්වල මහතා |
| **21.** ගරු සභික | - N.D.L.නිවුන්හැල්ල මහතා |
| **22.** ගරු සභික | - S.රෙජිනෝල්ඩ් මහතා |
| **23.** ගරු සභික | - N.M.M.ජින්නා මහතා |
| **24.** ගරු සභික | - A.M.T.සම්පත් අධිකාරි මහතා |
| **25.** ගරු සභික | - M.K.A.J.S.අනුරුද්ධ ජයතිලක මහතා |
| **26.** ගරු සභික | - M.H.ෆරූකාන් මහතා |

**<u>නොපැමිණි සභිකවරු</u>**

01.ගරු සභික - R.M.සුනේත්‍රා කුමාරි මහත්මිය

**<u>සහභාගී වූ නිලධාරීන්</u>**

ලේකම් - ඒ.එම්.ඒ.එස්.කේ.රත්නායක මිය
සංවර්ධන නිලධාරි - කේ.එන්.එම්.එන්.එස්.කරුණාරත්න මෙනවිය

**(අ) . ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදනය**

1.ගරු සභාපති හා ගරු උපසභාපති තෝරා පත් කර ගැනීමේ ගැසට් නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අංක 2438/92 හා 2025 මැයි මස 31 වැනි සෙනසුරාදා දිනැති ගැසට් පත්‍රය මඟින් කැකිරාව ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති වශයෙන් සිදත් චාමර බණ්ඩාර මුදියන්සේ මහතා හා ගරු උප සභාපති වශයෙන් ලොකුරාලගේ සුජීව වජිර කාන්ත ඉමඳුව මහතා යන අය තෝරාපත් කර ඇති බව ගරු සභාව වෙත දැනුවත් කරන ලදී.

**(ආ) සංදේශ හෝ පෙත්සම්/සන්නිවේදන සභාව වෙත ඉදිරිපත් කිරීම**

1. පළාත් පාලන කොමසාරිස්ගේ අංක NCP/LG/AC/06/13 හා 2025.05.28 දිනැතිව2025 අයවැය ඇස්තමේන්තු මඟින් සලසන ලද පුනරාවර්තන ප්‍රතිපාදන සම්බන්ධයෙන් එවා ඇති ලිපිය

2.පළාත් පාලන කොමසාරිස්ගේ අංක NCP/CM/PD/4/04 හා 2025.05.27 දිනැතිව ප්‍රාදේශීය සභා මටටමින් තෝරාගත් මංසන්ධිවල සූර්ය විදුලි ලාම්පු ස්ථාපනය කිරීම මැයෙන් එවා ඇති ලිපිය

3. පළාත් පාලන කොමසාරිස්ගේ අංක NCP/CM/PD/4/05 හා 2025.05.26 දිනැතිව ප්‍රාදේශීය සභා මටටමින් ග්‍රාමීය විදුලි ව්‍යාපෘති සඳහා යෝජනා ලබා ගැනීම සම්බන්ධව එවා ඇති ලිපිය

4. . පළාත් පාලන කොමසාරිස්ගේ අංක NCP/LG/AD/14/08/02 හා 2025.05.27 දිනැතිව එවා ඇති ලිපියට අනුව කැකිරාව ප්‍රාදේශීය සභාවේ නැණසල මධ්‍යස්ථානය සඳහා පරිගණක පුහුණු උපදේශකවරයෙකු බඳවා ගැනීම හා

න්‍යාය පත්‍රයට ඇතුලත් නොවූ එදිනට ඉදිරිපත් කරන ලද සහා අනුමැතිය ලබා ගත යුතු අත්‍යවශ්‍ය කරුණු සම්බන්ධ ලිපි සභාවට ඉදිරිපත් කරන ලදී.

5.පළාත් පාලන කොමසාරිස්ගේ අංක NCP/LG/PL/02/18/ Sntry- Fclty හා 2025.06.19 දිනැතිව එවා ඇති ලිපිය ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ නාගරික ප්‍රදේශවල පොදු මහජනතාව හා සංචාරකයින් සඳහා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීමේ වැඩසටහන - 2025

6. පළාත් පාලන කොමසාරිස්ගේ අංක NCP/LG/AD/03/secretary(iii) හා 2025.06.19 දිනැතිව එවා ඇති ලිපිය ධුර කාලය අවසන් වූ පළාත් පාලන ආයතනවල ප්‍රාදේශිය සභා පනතේ 9.3 වගන්තිය අනුව කාර්ය කර්තව්‍ය ඉටු කිරීම වෙනුවෙන් දීමනා ඉල්ලීම

7.ප්‍රධාන ලේකම්ගේ අංක NCP/CM/ED10/(2025 හා 2025.06.19 දිනැතිව එවා ඇති ලිපිය අනුරාධපුර ඓතිහාසික ශ්‍රී දළදා පෙරහැර සඳහා මූල්‍ය අනුග්‍රාහකත්වය ලබා ගැනීම සම්බන්ධව

8. (EDOTCO Group Sdn Bhd) ඊඩොටිකෝ සර්විසස් ලංකා (පුද්) සමාගම, මෙහෙයුම් අධ්‍යක්ෂගේ අංක ESLL/LMP/2025/LA/S/098 හා 2025ජූනි මස 16 වෙනි දිනැතිව යොමු කරන ලද ලිපිය
කැකිරාව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ දුරකථන හා අන්තර්ජාල සේවා ආවරණය වැඩි දියුණු කිරීම සඳහා බහුකාර්ය පහන් කණුවක් ස්ථාපිත කිරීම සම්බන්ධව

9. උමැප/කැකි/ප්‍රාස/05/01/02 හා 2025.06.25 දිනැතිව යොමු කරන ලද ලිපිය
ආපදා ණය ලබාදීම - ආර්.තර්මු මයා

10.ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, දිස්ත්‍රික් කළමණාකරුගේ අංක 24/03/02/16 දිනැතිව යොමු කරන ලද ලිපිය - පොදු ඉඩමේ අනවසරයෙන් නිවසක් ඉදි කිරීම

**(ඇ) කල්දෙනු ලැබූ ප්‍රශ්න ඉදිරිපත් කිරීම -නැත**

**(ඈ) කල්දෙනු ලැබූ යෝජනා ඉදිරිපත් කිරීම.**

<u>ගරු සභාපති සිදත් චාමර බංඩාර මහතා</u>

කල් දී තිබූ යෝජනා අතරට , 2025.06.06 වන දින විශේෂ මහ සභාවේ දී සාකච්ජා කරන ලද පහත සඳහන් තීරණ මහ සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා න්‍යාය පත්‍රයට ඇතුලත් කරන ලදී.

**<u>සභා තිරණ අංක 2025/01</u>**

**<u>ගරු සභාපති සිදත් චාමර බංඩාර මහතා</u>**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අංක 2438/92 හා 2025 මැයි මස 31 වැනි සෙනසුරාදා දිනැති ගැසට් පත්‍රය මඟින් කැකිරාව ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති වශයෙන් සිදත් චාමර බණ්ඩාර මුදියන්සේ මහතා හා ගරු උප සභාපති වශයෙන් ලොකුරාලගේ සුජීව වජිර කාන්ත ඉමදූව මහතා යන අය තෝරාපත් කර ඇති බව ගරු සභාව වෙත දැනුවත් කරන ලද අතර, ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරිමට සුදුසු බවට යෝජනා කරන ලදී.

**<u>සභා තිරණ අංක 2025/02</u>**

**<u>ගරු සභික A.A.ලයනල් මහතා</u>**

2025 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය සාරංශය සංශෝධනයන්ට යටත්ව සම්මත කිරිම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>ගරු සභික S.ජෙගදීසන් මහතා</u>

එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සඳහා සංශෝධන හෝ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් එය සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කෙරින

I .ගරු සභාවේ බලතල සභාපතිවරයා වෙත පැවරීම

**<u>සභා තිරණ අංක 2025/03</u>**

**<u>ගරු සභික M.G.ප්‍රභාත් වීරසේන</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 8-1 වගන්තිය ප්‍රකාරව කැකිරාව ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති සිදත් චාමර බණ්ඩාර මුදියන්සේ මහතාට කැකිරාව ප්‍රාදේශීය සභාවේ විධායක නිලධාරියා ලෙස ප්‍රාදේශිය සභා පනතින් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ විධානය කරනු ලැබ ඇති හෝ පවරනු ලැබ ඇති හෝ සියළු විධායක ක්‍රියා කිරිම සහ වගකීම් ඉටු කිරිම සඳහා බලය පැවරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**<u>ගරු සභික K.සබුරාන් මහතා</u>**

එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සඳහා සංශෝධන හෝ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් එය සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කෙරින.

II.1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 හා 1988.01.08 දරණ ප්‍රාදේශිය සභා රීති සංග්‍රහයේ 31 වන වගන්තිය යටතේ කාරක සභා හා උපදේශණ කාරක සභා පත් කිරීමේ යෝජනාව

මේ සඳහා පත්කර ගන්නා ලද කමිටුවලට අදාලව එක් එක් කමිටුව සඳහා සාමාජිකයෙකු පත් කර ගත යුතුව ඇති බැවින් ,ඒ සඳහා සාමාජිකයෙකු පත් කිරිමට කටයුතු කරන ලෙස සභාවට ඉදිරිපත් කරන ලදී, සාමාන්‍යයෙන් කමිටුවක සාමාජිකයින් ඔත්තේ සංඛ්‍යාවක් විය යුතු බැවින් , එසේ සිදු කිරිමට කටයුතු කරන බව පවසා සිටින ලදී.

**<u>සභා තිරණ අංක 2025/04</u>**

**<u>ගරු සභික M.G.ප්‍රභාත් වීරසේන මහතා</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 හා 1988.01.08 දරණ ප්‍රාදේශිය සභා රීති සංග්‍රහයේ 31 වන වගන්තිය යටතේ කාරක සභා පත් කිරිමට අදාලව සභාව මඟින් ක්‍රියාත්මක කමිටු සඳහා සාමාජිකයින් පහත පරිදි පත් කිරිම සුදුසු බවට යෝජනා කරන ලදී

**<u>ගරු සභික N.D.L.නිවුන්හැල්ල මහතා</u>**

එම යෝජනාව ස්ථිර කරන ලදී.

එම යෝජනාව සඳහා සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කෙරින.

- මුදල් හා ප්‍රතිපත්ති කමිටුව

| තනතුර | නම |
|---|---|
| 01. ගරු සභාපති | සිදත් චාමර බංඩාර මුදියන්සේ මහතා |
| 02. ගරු උප සභාපති | L.S.W.K.ඉමදූව මහතා |
| 03. ගරු සභික | C.A.H.M.නිමල්සිරි චන්ද්‍රසේකර මහතා |
| 04. ගරු සභික | H.නවරත්න බංඩාර මහතා |
| 05. ගරු සභික | A.A.ලයනල් මහතා |
| 06. ගරු සභික | M.G.ප්‍රභාත් වීරසේන මහතා |
| 07. ගරු සභික | D.U.G.N.B.දොඩම්වල මහතා |
| 08. ගරු සභික | N.D.L.නිවුන්හැල්ල මහතා |
| 09. ගරු සභික | A.M.T.සම්පත් අධිකාරි මහතා |

- නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව

| තනතුර | නම |
|---|---|
| 01. ගරු සභාපති | සිදත් චාමර බංඩාර මුදියන්සේ මහතා |
| 02. ගරු සභික | H.M.කිත්සිරි හේරත් මහතා |
| 03. ගරු සභික | S.ජෙගදීසන් මහතා |
| 04. ගරු සභික | R.M.සුනේත්‍රා කුමාරි මිය |
| 05. ගරු සභික | P.G.සන්ත දිසානායක මහතා |
| 06. ගරු සභික | I.T.M.C.C.B.පොතුහැර මහතා |
| 07. ගරු සභික | S.රෙජිනෝල්ඩ් මහතා |
| 08. ගරු සභික | M.K.A.J.S.අනුරුද්ධ ජයතිලක මහතා |
| 09. ගරු සභික | M.H.ෆරුකාන් මහතා |

- කාර්මික සේවා කමිටුව

| තනතුර | නම |
|---|---|
| 01.ගරු සභාපති | සිදත් චාමර බංඩාර මුදියන්සේ මහතා |
| 02.ගරු සභික | B.ආනන්ද ජයරත්න මහතා |
| 03.ගරු සභික | H.M.චමින්ද කුමාර විජේරත්න මහතා |
| 04.ගරු සභික | H.නවරත්න බංඩාර මහතා |
| 05.ගරු සභික | G.අනුර බංඩාර මහතා |
| 06.ගරු සභික | M.M.කුමාරසිංහ බංඩා මහතා |
| 07.ගරු සභික | D.D.විජේසිංහ මහතා |
| 08.ගරු සභික | M.G.ප්‍රභාත් වීරසේන මහතා |
| 09. ගරු සභික | N.M.M.ජින්නා මහතා |
| 10. ගරු සභික | K.සබුරාන් මහතා |

- පරිසර හා පහසුකම් කමිටුව

| | තනතුර | නම |
|---|---|---|
| 01. | ගරු සභාපති | සිදත් චාමර බංඩාර මුදියන්සේ මහතා |
| 02. | ගරු සභික | A.D.P.කුමාර අබේසේකර මහතා |
| 03. | ගරු සභික | J.E.D.ප්‍රියදර්ශණී එදිරිසිංහ මිය |
| 04. | ගරු සභික | B.B.අසංක ජයසූරිය මහතා |
| 05. | ගරු සභික | A.A.ලයනල් මහතා |
| 06. | ගරු සභික | I.T.M.C.C.B.පොතුහැර මහතා |
| 07. | ගරු සභික | K.සබුරාන් මහතා |
| 08. | ගරු සභික | D.U.G.N.B.දොඩම්වල මහතා |
| 09. | ගරු සභික | N.D.L.නිවුන්හැල්ල මහතා |

කැකිරාව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් හා කර්තවයන් සිදු කරගෙන යාමට අදාලව ස්වර්ණ පුරවර කාර්ය සාධන ඇගයීම් සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව උපදේශණ කාරක පත්කිරීමටත් කටයුතු කළ යුතු වෙනවා.

III. වර්ෂයේ ඉදිරි මාස සඳහා මහ සභා රැස්වීම් දින තීරණය කිරීම

**<u>සභා තීරණ අංක 2025/05</u>**

**<u>ගරු සභාපති සිදත් චාමර බංඩාර මහතා</u>**

මාසික මහ සභාව සඳහා සෑම මසකම අවසාන සතියේ අගහරුවාදා දිනයක් යොදා ගැනීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**<u>ගරු සභික M.K.A.J.S.අනුරුද්ධ ජයතිලක මහතා</u>**

එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සඳහා සංශෝධන හෝ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් එය සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කෙරින

**<u>සභා තීරණ අංක 2025/06</u>**

**<u>ගරු සභික M.G.ප්‍රභාත් වීරසේන මහතා</u>**

2021 ,2022 වර්ෂයන්වල පවතින හිඟ කුලී අය කර ගැනීමට අදාලව විගණන විමසුමට ලක්ව ඇති බැවින්, මේ සම්බන්ධව පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් අනුව විමර්ශනයක් පැවැත්වීමට කටයුතු කිරීමට සුදුසු බවට යෝජනා කරන ලදී.

**<u>ගරු සභික M.K.A.J.S.අනුරුද්ධ ජයතිලක මහතා</u>**

එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සඳහා සංශෝධන හෝ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් එය සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කෙරින.

**<u>සභා තීරණ අංක 2025/07</u>**

**<u>ගරු සභික H.M.චමින්ද කුමාර විජේරත්න මහතා</u>**

2025 වර්ෂයේ පළාත් නිශ්චිත ප්‍රධාන යටතේ ඉදිරිපත් කර ඇති මාර්ග සංවර්ධනය කිරීමේ සංවර්ධන යෝජනා ජනතා ඉල්ලීම් අනුව සංශෝධනය කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

| අ.අ. | ව්‍යාපෘතියේ අංකය | ව්‍යාපෘතියේ නම | සංශෝධිත ව්‍යාපෘතිය |
|---|---|---|---|
| 01. | 25/610/52/07/2201/24 (iv)N/A/67 | 638 සෙම්බුකුලිය තුලානේ ඒ නමය මාර්ගය සෙම්බුකුලිය තිබ්බටුවැවවිද්‍යාලය අසලින් ඔලොම්බෑව දක්වා මාර්ගය සංවර්ධනය කිරීම | 638 සෙම්බුකුලිය තුලානේ ඒ නමය මාර්ගය සෙම්බුකුලිය තිබ්බටුවැවවිද්‍යාලය අසලින් ඔලොම්බෑව දක්වා මාර්ගය බොරළු දමා සංවර්ධනය කිරීම |
| 02 | 25/610/52/07/2201/24 (iv)N/A/68 | 641 මහ ඇලගමුව ආරිවංශ මහතාගේ කඩය අසල සිට පාලම දක්වා දිවෙන මාර්ගය සංවර්ධනය | 641 මහ ඇලගමුව ආරිවංශ මහතාගේ කඩය අසල සිට පාලම දක්වා දිවෙන මාර්ගය බොරළු දමා සංවර්ධනය කිරීම |
| 03 | 25/610/52/07/2201/24 (iv)N/A/71 | ඩබ්.එස්.කුමාරසිරි මහතාගේ නිවස අසල සිට යසන්තා කුමාරි මියගේ නිවස දක්වා අතුරු මාර්ගය කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම - අදියර 01 | ඩබ්.එස්.කුමාරසිරි මහතාගේ නිවස අසල සිට යසන්තා කුමාරි මියගේ නිවස දක්වා අතුරු මාර්ගය බොරළු දමා සංවර්ධනය කිරීම - අදියර 01 |

**ගරු සභික M.M.කුමාරසිංහ බංඩා මහතා**
එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සඳහා සංශෝධන හෝ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් එය සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කෙරින.

"ප්‍රාදේශිය සභා පනතේ අංක 216 යටතේ වියදම් කිරිමේ සීමාවන් නියම කිරිම සඳහා සභාපති හා ලේකම් වෙත බලය පැවරීමට අදාලව කටයුතු කිරිම

**සභා තිරණ අංක 2025/08**
**ගරු සභික M.G.ප්‍රභාත් වීරසේන මහතා**

"ප්‍රාදේශිය සභා පනතේ අංක 216 යටතේ වියදම් කිරිමේ සීමාවන් නියම කිරිම සඳහා සභාපති හා ලේකම් වෙත බලය පැවරීමටත්, පොදු පරිපාලන කටයුතු සඳහා වියදම් දැරිම සඳහා රු. ලක්ෂ 05 ක උපරිමයකට යටත්ව වියදම් දැරීමට අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**ගරු සභික N.D.L.නිවුන්හැල්ල මහතා**
එම යෝජනාව ස්ථිර කරන ලදී.
ඉහත යෝජනාව සඳහා සංශෝධන හෝ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් එය සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කෙරින.

**සභා තිරණ අංක 2025/09**
**ගරු සභික P.G.සන්ත දිසානායක මහතා**
"ප්‍රාදේශිය සභා පනතේ අංක 8(2) යටතේ උප සභාපති හා වෙනත් නිලධාරින් වෙත බලය පැවරීම සුදුසු බවට මම යෝජනා කරන ලදී.

**ගරු සභික H.M.කිත්සිරි හේරත් මහතා**
එම යෝජනාව ස්ථිර කරන ලදී.
ඉහත යෝජනාව සඳහා සංශෝධන හෝ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් එය සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කෙරින.

**සභා තිරණ අංක 2025/10**
**ගරු සභික A.A.ලයනල් මහතා**
"ප්‍රාදේශිය සභා පනතේ අංක 78 වගන්තිය මඟින් සභාව වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරිමේ බලය කැකිරාව ප්‍රාදේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින් වෙත පැවරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**ගරු සභික H.M.චමින්ද කුමාර විජේරත්න මහතා**
එම යෝජනාව ස්ථිර කරන ලදී.
ඉහත යෝජනාව සඳහා සංශෝධන හෝ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් එය සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කෙරින.

**සභා තිරණ අංක 2025/11**
**ගරු සභික S.රෙජිනෝල්ඩ් මහතා**
"ප්‍රාදේශිය සභා පනතේ අංක 43 යටතේ අනතුරුදායක ගස් ඉවත් කිරිමේ නිසි බලධරයා ලෙස කැකිරාව ප්‍රාදේශිය සභාවේ සභාපතිවරයා වෙත බලය පැවරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු සභික N.M.M.ජින්නා මහතා**
එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සඳහා සංශෝධන හෝ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් එය සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කෙරින.

“ප්‍රසම්පාදන කමිටුව (භාණ්ඩ හා සේවා) 2025 01.01 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කමිටු සඳහා සාමාජිකයින් පත් කිරීමට අදාලව පහත සඳහන් සුදුසු බවට මම යෝජනාවට අදාලව **ගරු සභික P.G.සන්ත දිසානායක මහතා** විසින් ගරු සභික C.A.H.M.නිමල්සිරි චන්ද්‍රසේකර මහතාගේ හා ගරු සභික R.M.සුනේත්‍රා කුමාරි මහත්මියගේ යන අයගේ නම් යෝජනා කරන ද අතර, **ගරු සභික M.G.ප්‍රභාත් වීරසේන මහතා** විසින් පවසා සිටියේ මෙය සභාවේ ඉතා වැදගත් කාර්යයක් වන බැවින් , ඒ සම්බන්ධව දැනුමැත තිබෙන අයෙක් පත් කිරීම සුදුසු බවත්, තාක්ෂණය සම්බන්ද දැනුම ඇති අයෙක් ලෙස ගරු සභික D.U.G.N.B.දොඩම්වල මහතා ඒ සඳහා සුදුසු බවයි. **ගරු සභික G.අනුර බංඩාර මහතා** විසින් ද පවසා සිටියේ විපක්ෂය නියෝජනය කරමින් සාමාජිකයෙකු පත් කිරීමට අවස්ථාව ලබා දීම වඩා සුදුසු බවයි. ඒ අනුව **ගරු සභික M.K.A.J.S.අනුරුද්ධ ජයතිලක මහතාගේ** හා **ගරු සභික S.රෙජිනෝල්ඩ් මහතාගේ** යෝජනා ස්ථිරත්වයෙන් ගරු සභික D.U.G.N.B.දොඩම්වල මහතාගේ නම සඳහන් කරන ලදී . එමෙන්ම **ගරු සභික I.T.M.C.C.B.පොතුහැර මහතා** විසින් පවසා සිටියේ සභාවේ නොමැති අයෙක් යම් තනතුරක් සඳහා පත් කිරීමට හැකියාවක් නොමැති බවයි. ඒ අනුව **ගරු සභික H.M.කිත්සිරි හේරත් මහතා** විසින් ගරු සභික J.E.D.ප්‍රියදර්ශණී එදිරිසිංහ මහත්මියගේ නම යෝජනා කරන ලදී.මෙහිදී නම් දෙකක් යෝජනා වී ඇති බැවින්, ගරු සභික D.U.G.N.B.දොඩම්වල මහතා ඉල්ලා අස්වන බව පවසා සිටින ලදී.

**සභා තීරණ අංක 2025/12**

**ගරු සභික P.G.සන්ත දිසානායක මහතා**

“ප්‍රසම්පාදන කමිටුව (භාණ්ඩ හා සේවා) 2025 01.01 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය අනුව කමිටු සඳහා සාමාජිකයින් පත් කිරීමට අදාලව මහජන නියෝජිතයින් ලෙස පහත නම් සඳහන් අය ද ඇතුලත්ව කමිටු සාමාජිකයින් පත් කිරීමටත්, වැඩ සඳහා මිලියන 2 ක් ද, භාණ්ඩ සඳහා මිලියන 01 ක් ද,උපරිම සීමාවට යටත්ව වියදම් දැරීම සඳහා බලය ලබා දීමටත් ,සුදුසු බවට යෝජනා කරන ලදී .

**ප්‍රසම්පාදන කමිටුව**

1. සභාපති - ගරුසභාපති සිදත් චාමර බණ්ඩාර මුදියන්සේ මහතා
2. මහජන නියෝජිතයින් ලෙස - ගරු සභික C.A.H.M.නිමල්සිරි චන්ද්‍රසේකර මහතා
   - ගරු සභික J.E.D.ප්‍රියදර්ශණී එදිරිසිංහ මහත්මිය
3. මාණ්ඩලික නිලධාරි ලෙස - ලේකම්
4. වෙනත් ආයතනයක මාණ්ඩලික නිලධාරි-01
5. තාක්ෂණ නිලධාරි - 01
6. ප්‍රධාන කළමනාකරණ නිලධාරි

**ගරු සභික D.D.විජේසිංහ මහතා**

එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සඳහා සංශෝධන හෝ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් එය සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කෙරින.

**සභා තීරණ අංක 2025/13**

**ගරු සභික C.A.H.M.නිමල්සිරි චන්ද්‍රසේකර මහතා**

“ අතුරු ව්‍යවස්ථාව අනුව පුස්තකාල උපදේශණ කමිටු සාමාජිකයින් පත් කිරීමට අදාලව මහජන නියෝජිතයින් ලෙස පහත නම් සඳහන් අය ද ඇතුලත්ව කමිටුව සාමාජිකයින් පත් කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**පුස්තකාල උපදේශණ කමිටුව**

1.උපදේශණ කමිටු සභාපති - සභාවේ ගරු සභාපති

2. උපදේශණ කමිටු ලේකම් - පුස්තකාලයාධිපති

3.කමිටු සාමාජික

I. ප්‍රාදේශිය සභා ලේකම්
II. ගරු සභික P.G.සන්ත දිසානායක මහතා
III. ගරු සභික H.M.කිත්සිරි හේරත් මහතා
IV. ප්‍රජා සංවර්ධනනිලධාරි

V. කාර්මික නිලධාරි
VI. පුස්තකාල සහයක (කැකිරාව මහජන පුස්තකාලය)
VII. පුස්තකාල සහයක (මරදන්කඩවල මහජන පුස්තකාලය)
VIII. පුස්තකාල සහයක (මඩාටුගම මහජන පුස්තකාලය)
IX. පුස්තකාල සහයක (පලුගස්වැව මහජන පුස්තකාලය)
X. පුස්තකාල සහයක (හබරණ මහජන පුස්තකාලය)

4. බාහිර කමිටු සාමාජික

| | | |
|---|---|---|
| I. | මුස්ලිම් විද්‍යාලයේ විදුහල්පතිනිය ලේඛිකා | - සුලෙයිහා බෙගම් මහත්මිය |
| II. | සංස්කෘතික නිලධාරි,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | - උදයංගනී මහත්මිය |
| III. | ආදි ශිෂ්‍ය සංගම් ලේකම් | - තල්ගොඩ පිටිය මහතා |
| IV. | ගුරු වෘත්තිය,කොටාගල පිරිවෙන | - නිලන්ත මහතා |
| V. | වෙළඳ සංගමය වෙනුවෙන් | - ආර්.පී.ජී.ධර්මසේන මහතා |

**<u>ගරු සභික මහතා B.ආනන්ද ජයරත්න මහතා</u>**

එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සඳහා සංශෝධන හෝ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් එය සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කෙරින.

**<u>සභා තිරණ අංක 2025/14</u>**

**<u>ගරු සභික M.M.කුමාරසිංහ බංඩා මහතා</u>**

" ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන පනතේ 21 වගන්තිය යටතේ කැකිරාව ප්‍රාදේශීය සභාවේ සැලසුම් කමිටුව හා පරීක්ෂණ කමිටුව සඳහා සාමාජිකයින් පත් කිරිමේ අදාල ආයතන නිලධාරින් පත් කිරිම සුදුස බවට මම යෝජනා කරන ලදී.

**<u>සැලසුම් කමිටු සාමාජිකයින්</u>**

1. ගරු සභාපති
2. ලේකම්
3. තාක්ෂණ නිලධාරි
4. නාගරික සංවර්ධන අධිකාරිය නියෝජිත
5. ඉඩම් නිලධාරි

**<u>ගරු සභික S.ජෙගදීසන් මහතා</u>**

එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සඳහා සංශෝධන හෝ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් එය සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කෙරින.

**<u>යෝජනා අංක 2025/15</u>**

**<u>ගරු සභික C.A.H.M.නිමල්සිරි චන්ද්‍රසේකර මහතා</u>**

" අංක 1988 අංක 56, 2000 අංක 53 දරණ පනත මගින් සංශෝධිත වූ 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත අනුව කැකිරාව ප්‍රාදේශීය සභාවේ පරිසර කමිටුව හා පරීක්ෂණ කමිටුව සඳහා සාමාජිකයින් පත් කිරිම සුදුසු බවට යෝජනා කරන ලදී.

| <u>පරිසර කමිටුව</u> | <u>පරීක්ෂණ කමිටුව</u> |
|---|---|
| 1. ලේකම් | 1 .පරිසර නිලධාරි |
| 2. මධ්‍යම පරිසර අධිකාරියේ නියෝජිත | 2. මහජන සෞඛ්‍ය පරික්ෂක |
| 3.පරිසර නිලධාරි | 3.තාක්ෂණ නිලධාරි |
| 4.බීට්ටු වන නිලධාරි | 4. ප්‍රජා සංවර්ධන නිලධාරි |
| 5.මහජන සෞඛ්‍ය පරික්ෂක | 5.ආදායම් පරීක්ෂක |
| 6. ඉඩම් නිලධාරි | |

**ගරු සභික M.M.කුමාරසිංහ බංඩා මහතා**
එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සඳහා සංශෝධන හෝ විරෝධතා ඉදිරිපත් කිරිමෙන් අනතුරුව බහුතරය පක්ෂව කැමැත්ත පල කල බැවින්, එය වැඩි ඡන්දයෙන් සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කෙරින.

**ගරු සභාපති සිදත් චාමර බංඩාර මහතා**
පළාත් පාලන කොමසාරිස්ගේ අංක NCP/LG/AC/06/13 හා 2025.05.28 දිනැතිව2025 අයවැය ඇස්තමේන්තු මඟින් සලසන ලද පුනරාවර්තන ප්‍රතිපාදන සම්බන්ධයෙන් එවා ඇති ලිපියට අනුව
කැකිරාව ප්‍රාදේශීය සභාවේ 2025 වර්ෂයේ අයවැය සංශෝධනය කර ප්‍රතිපූර්ණය නොවන 20% වැටුප් ගෙවීම සඳහා අයවැය ප්‍රතිපාදන සලසා ගැනීම සම්බන්ධව අනුමැතියක් ලබා ගත යුතු බව පවසා සිටින ලදී.

මෙම යෝජනාව සම්බන්ධව ගරු සභාව විසින් පැහැදිලි කිරිමක් අවශ්‍ය බව ඉල්ලා සිටින ලදී. ඒ අනුව **ගරු සභික ගරු සභික A.A.ලයනල් මහතාගේ** හා **ගරු සභික එස්.ජෙගදිසන් මහතාගේ** යෝජනා ස්ථිරත්වයෙන් මහා සභාව කාරක සභාවක් බවට පත් පත් කරන ලදී. අදාල යෝජනාව සම්බන්ධව ලේකම්තුමිය විසින් ගරු සභාව වෙත පැහැදිලි කිරිම කිරිම සිදු කරන ලද අතර, අනතුරුව **ගරු සභික H.නවරත්න බංඩාර මහතාගේ** හා **ගරු සභික B.B.අසංක ජයසූරිය මහතාගේ** යෝජනා ස්ථිරත්වයෙන් නැවත සභාව මහ සභාවක් බවට පත් කරන ලදී.

**ගරු සභික M.G.ප්‍රභාත් වීරසේන මහතා** 2010 වර්ෂයේ පමණ සිට මෙම යෝජනාව ඉදිරිපත් වූ නමුත්, සභාවක් ලෙස මෙම යෝජනාවට එකඟ නොවූ බවත්, එලෙස රාජ්‍ය නිලධාරින්ගේ වැටුප් කප්පාදු කර ,සභා අරමුලින් ගෙවීමට සිදු වන්නේ බල ප්‍රදේශයේ ජනතාවට සේවය කිරිමට තිබෙන මුදල් බවයි. එමෙන්ම මෙවැනි තීරණයක් ගැනීමේ දී එය ඉදිරි අනාගතයට දැඩි සේ බල පාන බැවින් , විපක්ෂයක් ලෙස මෙම යෝජනාවට සඳහා විරුද්ධත්වය ප්‍රකාශ කරන බවට යෝජනා කරන ලද අතර, **ගරු සභික A.M.T.සම්පත් අධිකාරි මහතා** විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී.

එබැවින් මෙම යෝජනාවට එකඟවිය නොහැකි බව පවසා සිටින ලදී. **ගරු සභික M.M.කුමාරසිංහ බංඩා මහතා** රජයේ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරිමේ දී ඒ සඳහා සහය ලබා දීමට මහජන නියෝජිතයින් ලෙස බැඳී සිටින බවත්, එම නිසා මෙම යෝජනාවට අනුමැතිය ලබා දීම සුදුසු බව පවසා සිටින ලදී. **ගරු සභික A.A.ලයනල් මහතා** පෞද්ගලිකව මෙම යෝජනාව සඳහා එකඟ නොවුනත්, රජය විසින් ගන්නා ලද තීරණයන්ට අවශ්‍ය සහය ලබා දිය යුතු බව පවසා සිටින ලදී.

**සභා තිරණ අංක 2025/16**
**ගරු සභික M.M.කුමාරසිංහ බංඩා මහතා**
පළාත් පාලන කොමසාරිස්ගේ අංක NCP/LG/AC/06/13 හා 2025.05.28 දිනැතිව2025 අයවැය ඇස්තමේන්තු මඟින් සලසන ලද පුනරාවර්තන ප්‍රතිපාදන සම්බන්ධයෙන් එවා ඇති ලිපියට අනුව
කැකිරාව ප්‍රාදේශීය සභාවේ 2025 වර්ෂයේ අයවැය සංශෝධනය කර ප්‍රතිපූර්ණය නොවන 20% වැටුප් ගෙවීම සඳහා අයවැය ප්‍රතිපාදන සලසා ගැනීමේ දී සභා අරමුදල් මඟින් ගෙවීම් කටයුතු සිදු කිරිමට සුදුසු බවට යෝජනා කරන ලදී.

**ගරු සභික A.A.ලයනල් මහතා**
එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සඳහා සංශෝධන හා විරෝධතා ඉදිරිපත් කිරිමෙන් අනතුරුව විරෝධතා ඉදිරිපත් වූ හෙයින් වැඩිදෙනා පක්ෂව කැමැත්ත පල කල බැවින්, එය වැඩි කැමැත්ත මත සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කෙරින.

**සභා තිරණ අංක 2025/17**
**ගරු සභික M.M.කුමාරසිංහ බංඩා මහතා**
කැකිරාව ප්‍රාදේශීය සභාවේ කාර්යයන් හා කර්තවයන් සිදු කරගෙන යාමට අදාලව ස්වර්ණ පුරවර කාර්ය සාධන ඇගයීම් සඳහාවන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව උපදේශණ කාරක සභා සඳහා කමිටු සාමාජිකයින්

ලෙස පහත නම් සඳහන් මහජන නියෝජිතයින් හා රාජ්‍ය ආයතන නිලධාරින් පත් කිරිමට සුදුසු බවට යෝජනා කරන ලදී.

- ආදායම් උත්පාදන උපදේශණ කමිටුව

1.කමිටු සභාපති - ගරු සභාපති, කැකිරාව ප්‍රාදේශිය සභාව,කැකිරාව
2.කමිටු සාමාජික - ලේකම්, කැකිරාව ප්‍රාදේශිය සභාව,කැකිරාව
3.කමිටු සාමාජික - ගරු උප සභාපති, L.S.W.K.ඉමදූව මහතා
4. කමිටු සාමාජික - ගරු සභික, C.A.H.M.නිමල්සිරි චන්ද්‍රසේකර මහතා
5. කමිටු සාමාජික - ගරු සභික, N.D.L.නිවුන්හැල්ල මහතා
6. කමිටු සාමාජික - පරිපාලන ග්‍රාම නිලධාරි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,කැකිරාව
7.කමිටු සාමාජික - සභාපති,වෙළඳ සංගමය,කැකිරාව
8.කමිටු සාමාජික - වෙළඳ ව්‍යාපාරික, කැකිරාව
9.කමිටු සාමාජික - ආදායම් පරීක්ෂක, කැකිරාව ප්‍රාදේශිය සභාව,කැකිරාව

- ඉංජිනේරු සහ පොදු කටයුතු සම්බන්ධ ගැටළු පිළිබඳ උපදේශණ කමිටුව

1.කමිටු සභාපති - ගරු සභාපති, කැකිරාව ප්‍රාදේශිය සභාව,කැකිරාව
2. කමිටු සාමාජික - ගරු සභික, D.U.G.N.B.දොඩම්වල මහතා
3. කමිටු සාමාජික - ගරු සභික, N.D.L.නිවුන්හැල්ල මහතා
4. කමිටු සාමාජික - ගරු සභික, A.A.ලයනල් මහතා
5. කමිටු සාමාජික - ගරු සභික, C.A.H.M.නිමල්සිරි චන්ද්‍රසේකර මහතා
6.කමිටු සාමාජික - ලේකම්, කැකිරාව ප්‍රාදේශිය සභාව,කැකිරාව
7. කමිටු සාමාජික - පරිපාලන ග්‍රාම නිලධාරි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,කැකිරාව
8.කමිටු සාමාජික - කොට්ඨාස සහකාර,ප්‍රාදේශිය ඉංජිනේරු කාර්යාලය,කැකිරාව
9.කමිටු සාමාජික - තාක්ෂණ නිලධාරි,ඉදිකිරීම් ද්‍රව්‍ය පරීක්ෂණාගාරය,කැකිරාව

- නීති හා ප්‍රතිපත්ති පිළිබඳ උපදේශණ කමිටුව

1.කමිටු සභාපති - ගරු සභාපති, කැකිරාව ප්‍රාදේශිය සභාව,කැකිරාව
2. කමිටු සාමාජික - ගරු සභික, N.D.L.නිවුන්හැල්ල මහතා
3. කමිටු සාමාජික - ගරු සභික P.G.සන්ත දිසානායක මහතා
4.කමිටු සාමාජික - ලේකම්, කැකිරාව ප්‍රාදේශිය සභාව,කැකිරාව
5.කමිටු සාමාජික - නීතිඥ , ප්‍රසිද්ධ නොතාරිස්,දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය ,කැකිරාව
6.කමිටු සාමාජික - තාක්ෂණ නිලධාරි, කැකිරාව ප්‍රාදේශිය සභාව,කැකිරාව
7.කමිටු සාමාජික - ආදායම් පරීක්ෂක, කැකිරාව ප්‍රාදේශිය සභාව,කැකිරාව

- පරිසර කළමනාකරණය හා ආරක්ෂණය පිළිබඳ උපදේශණ කමිටුව

1.කමිටු සභාපති - ගරු සභාපති, කැකිරාව ප්‍රාදේශිය සභාව,කැකිරාව
2. කමිටු සාමාජික - ගරු සභික, M.G.ප්රභාත් වීරසේන මහතා
3. කමිටු සාමාජික - ගරු සභික S.ජෙගදීසන් මහතා
4.කමිටු සාමාජික - ලේකම්, කැකිරාව ප්‍රාදේශිය සභාව,කැකිරාව
5. කමිටු සාමාජික - මහජන සෞඛ්‍ය පරීක්ෂක,සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය,කැකිරාව
6.කමිටු සාමාජික - පරිසර නිලධාරි, කැකිරාව ප්‍රාදේශිය සභාව,කැකිරාව
7.කමිටු සාමාජික - සභාපති,කැකිරාව වෙළඳ සංගමය,කැකිරාව

- ප්‍රාදේශිය ආර්ථික සංවර්ධනය ප්‍රාරම්භයන් පිළිබඳ උපදේශණ කමිටුව

1.කමිටු සභාපති - ගරු සභාපති, කැකිරාව ප්‍රාදේශිය සභාව,කැකිරාව
2.කමිටු සාමාජික - ගරු සභික M.K.A.J.S.අනුරුද්ධ ජයතිලක මහතා
3.කමිටු සාමාජික - ගරු සභික B.ආනන්ද ජයරත්න මහතා

4.කමිටු සාමාජික - ලේකම්, කැකිරාව ප්‍රාදේශිය සභාව,කැකිරාව
5. කමිටු සාමාජික - පරිපාලන ග්‍රාම නිලධාරි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,කැකිරාව
6.කමිටු සාමාජික - සභාපති,වෙළඳ සංගමය,කැකිරාව
7.කමිටු සාමාජික - සමාජ ක්‍රියාකාරී,

**ගරු සභික H.M.චමින්ද කුමාර විජේරත්න මහතා**
එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සඳහා සංශෝධන හෝ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් එය සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කෙරින.

**ගරු සභික, M.G.ප්‍රභාත් වීරසේන මහතා**
කැකිරාව ප්‍රාදේශිය සභාව මඟින් ක්‍රියාත්මක වූ නැණසල මධ්‍යස්ථානය ප්‍රදේශයේ දරුවන්ට නව තාක්ෂය ලබ දීම සඳහා ආරම්භ කරනු ලැබුවේ බොහෝ බාධක මධ්‍යයේ වන අතර, එය ආරම්භ කිරිම කළ යුතුම කාර්යයක් බවත්,එම නිසා සුදුසු කම් සපුරා ඇති අයෙකු බඳවා ගැනීමට කඩනමින් කටයුතු කල යුතු බවත් පවසා සිටින ලදී.

**සභා තිරණ අංක 2025/18**
**ගරු සභික, M.G.ප්‍රභාත් වීරසේන මහතා**
පළාත් පාලන කොමසාරිස්ගේ අංක NCP/LG/AD/14/08/02 හා 2025.05.27 දිනැතිව එවා ඇති ලිපියට අනුව කැකිරාව ප්‍රාදේශීය සභාවේ නැණසල මධ්‍යස්ථානය සඳහා පරිගණක පුහුණු උපදේශකවරයෙකුගේ අවශ්‍යතාව පවතින බැවින්, අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති අයෙකු බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු කිරිම සුදුසු බවට යෝජනා කරන ලදී.

**ගරු සභික, D.U.G.N.B.දොඩම්වල මහතා**
එම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු සභික, M.G.ප්‍රභාත් වීරසේන මහතා**
කැකිරාව ප්‍රාදේශිය සභාව මඟින් ක්‍රියාත්මක වූ නැණසල මධ්‍යස්ථානය ප්‍රදේශයේ දරුවන්ට නව තාක්ෂය ලබ දීම සඳහා ආරම්භ කරනු ලැබුවේ බොහෝ බාධක මධ්‍යයේ වන අතර, එය ආරම්භ කිරිම කළ යුතුම කාර්යයක් බවත්,එම නිසා සුදුසු කම් සපුරා ඇති අයෙකු බඳවා ගැනීමට කඩනමින් කටයුතු කල යුතු බවත් පවසා සිටින ලදී.

ඉහත යෝජනාව සඳහා සංශෝධන හෝ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් එය සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කෙරින.

**සභා තිරණ අංක 2025/19**
**ගරු සභාපති සිදත් චාමර බංඩාර මහතා**
**මාණ්ඩලික පත්‍රය**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 168 (1) වැනි වගන්තිය ප්‍රකාර මා වෙත පැවරී ඇති බලතල අනුව, මෙම වර්ෂය අවසන් වීමට පෙර 2026 වර්ෂය වෙනුවෙන් අයවැය ලේඛනයක් සකස් කර මා විසින් ඉදිරිපත් කළ යුතුව ඇත. එකී අයවැය ලේඛනය ප්‍රාදේශිය සභා රීතිවලින් නියම කරනු ලැබ ඇති දිනයේ දී හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතු බවත් එකී අයවැය ලේඛනය සකස් කළ යුත්තේ රීති වලින් නියමිත ආකෘති පත්‍ර වලින් බවත් මා මෙසේ ඔබ සැම දැනුවත් කරමි.

එකී නියම කර ඇති දිනයට මෙම අයවැය ලේඛනය සැකසීම, පහත පරිදි අයවැය කාලසටහනක් මගින් ඉටු කර ගැනීමට අපේක්ෂා කරන අතර මෙකී කාලසටහන අනුව ඔබ සියලුදෙනාගේම මෙන්ම ස්වේච්ඡා සංවිධාන වල ප්‍රධානීන්ගේ හා විශේෂයෙන්ම ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලයේ සම්පූර්ණ සහයෝගය හා දායකත්වය අපේක්ෂා කරමි.

කාලසටහන පරිදි නියමිත දිනට ඔබගේ අදහස් හා යෝජනා ලිඛිතව ලබා ගැනීමට ද මා අදහස් කර සිටින අතර සියලු දෙනාගේම දැන ගැනීම පිණිස මෙම මාණ්ඩලික පත්‍රය එකී දින වකවානු ද සමග මෙසේ ඉදිරිපත් කිරිමට සුදුසු බවට බවට යෝජනා කරමි.

**අයවැය කාලසටහන**

| අ. අ. | ක්‍රියාකාරකම්/පියවරයන් | අවසාන ඉලක්ක දිනය | වගකීම |
|---|---|---|---|
| 01 | මාණ්ඩලික පත්‍රයක් ඉදිරිපත් කිරීම | ජූනි 24 | සභාපති |
| 02 | අයවැය සඳහා අදහස් ලබා ගැනීම කොට්ඨාශ කමිටු යෝජනා ඉදිරිපත් කිරීම | ජූලි 31 | සභාපති ඇතුළු මන්ත්‍රීවරුන් / ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලය/ කමිටු සාමාජිකයින් |
| 03 | ආදායම් හා වියදම් පිළිබඳ ඒ ඒ අංශවල වාර්තා ලබා ගැනීම | ජූලි 31 | අංශ ප්‍රධානීන් හා විෂය භාර නිලධාරීන් |
| 04 | මූලික ඇස්තමේන්තු සකස් කිරීම | අගෝස්තු 31 | අංශ ප්‍රධානීන් හා විෂය භාර නිලධාරීන් |
| 05 | මූලික ඇස්තමේන්තු සමාලෝචනය | සැප්තැම්බර් 15 | සභාපති ඇතුළු මන්ත්‍රීවරුන් / ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලය/ කමිටු සාමාජිකයින් |
| 06 | අයවැය ප්‍රතිපත්ති තීරණය කිරීම හා සභාවට ඉදිරිපත් කිරීම | සැප්තැම්බර් 30 | සභාපති |
| 07 | අයවැය ඇස්තමේන්තු සකස් කිරීම | ඔක්තෝබර් 15 | අයවැය විෂයය භාර නිලධාරි |
| 08 | ඇස්තමේන්තු පරීක්ෂාව | ඔක්තෝබර් 31 | මහජනතාව හා ජන මාධ්‍යය |
| 09 | අයවැය වාර්තාව කෙටුම්පත් කිරීම/ අයවැය පණිවුඩය සැකසීම | නොවැම්බර් 15 | සභාපති/ අයවැය විෂයය භාර නිලධාරි |
| 10 | කෙටුම්පත් අයවැය ලේඛනය සභාවට ඉදිරිපත් කිරීම | නොවැම්බර් 30 | සභාපති |
| 11 | අවශ්‍යවේනම් සංශෝධිත අයවැය ලේඛනය දෙවන වර සභාවට ඉදිරිපත් කිරීම | දෙසැම්බර් 15 | සභාපති |
| 12 | අයවැය ලේඛනය ඉදිරිපත් කිරීම | දෙසැම්බර් 15 | සභාව |
| 13 | අයවැය ලේඛනය මුද්‍රණය කර බෙදා හැරීම | දෙසැම්බර් 31 | ලේකම් |

**ගරු සභික B.B.අසංක ජයසූරිය මහතා**
එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සඳහා සංශෝධන හෝ විරෝධතා ඉදිරිපත් නොවු හෙයින් එය සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කෙරින.

**සභා තිරණ අංක 2025 /20**
**ගරු සභික N.M.M.ජින්නා මහතා**
එළගව මස අලෙවිසැල් හා ගව ඝාතකාගාර වසා තැබීම සම්බන්ධව ටෙන්ඩර් බදු මුදල් කපා හැරීමට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීම සම්බන්ධව

කැකිරාව හා හා පලුගස්වැව යන පශු වෛද්‍ය කොට්ඨාසවල ඇති වූ කුර හා මුඛ රෝග තත්වය හේතුවෙන් 2025.02.07 දින සිට 2025.02.24 දින දක්වා දින 17 ක කාලයක් පහත එළගව මස් අලෙවිසැල් වසා තබන වසා තබන ලද බැවින්, එම කාලයට අදාළව ටෙන්ඩර් බදු මුදල් කපා හැරිමටත්,එය ආණ්ඩුකාර අනුමැතියට ඉදිරිපත් කර අවශ්‍ය කටයුතු සිදු කිරිමටත්,සුදුසු බවට යෝජනා කරන ලදී.

| අ.අ. | දේපළ | ටෙන්ඩර් මුදල රු. | කපා හැරිය යුතු මුදල රු. |
|---|---|---|---|
| 1 | මඩාටුගම එළගව මස් කඩය | 210,000.00 | 9,780.82 |

| | | | |
|---|---|---|---|
| 2 | හෝරාපොල එළගව මස් කඩය | 231,000.00 | 21,816,67 |
| 3 | බළලුවැව එළගව මස් කඩය | 55,000.00 | 5194.44 |
| 4 | බණ්ඩරපොතාන එළගව මස් කඩය | 1,057,500.00 | 99,875.00 |
| 5 | උල්පත එළගව මස් කඩය | 611,000.00 | 57,705.56 |
| 6 | කැකිරාව එළගව මස් කඩය | 2295340.00 | 216,782.11 |

**ගරු සභික H.M.චමින්ද කුමාර විජේරත්න මහතා**

එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සඳහා සංශෝධන හෝ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් එය සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කෙරින.

**සභා තිරණ අංක 2025/21**

**ගරු සභික N.D.L.නිවුන්හැල්ල මහතා**

කැකිරාව ප්‍රාදේශිය සභාවේ සේවයේ නියුතු පහත නම් සඳහන් නිලධාරි /සේවකයින්ගේ 2025 ජූනි මස අතිකාල ඉල්ලීම් කත්සේරු වාර්තා ඉදිරිපත් ඇති අතර, අධීක්ෂණ නිලධාරීන්ගේ නිර්දේශය මත අතිකාල සිදු කිරිමටත්, ඒ අනුව ගෙවීම් කිරිමටත්, අනුමැතිය ලබා දීමට සුදුසු බවටත් , දෙපාර්තමේන්තුව මඟින් අනුමැතිය ලබා ගත යුතු නිලධාරීන්ගේ/සේවකයින්ගේ තක්සේරු වාර්තා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරිමට කටයුතු කිරිම සුදුසු බවට යෝජනා කරනවා.

| අ.අ | නම | තනතුර | ඉල්ලුම්කළ පැය ගණන |
|---|---|---|---|
| 01 | එච්.එම්.සී.හේරත් මයා | ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරි | 50 |
| 02 | එස්.රුක්මණී පද්මසිරි මිය | පුස්තකාලයාධිපති | 40 |
| 03 | කේ.එන්.එම්.එන්.එස්.කරුණාරත්න මෙය | සංවර්ධන නිලධාරි | 40 |
| 04 | කේ.ජී.අයි.ඒකනායක මිය | කළමනාකරණ සේවා නිලධාරි | 40 |
| 05 | ටී.එම්.කේ.කේ.ජයවර්ධන මිය | කළමනාකරණ සේවා නිලධාරි | 40 |
| 06 | යූ.බී.ජී.ඩබ්.එම්.එන්.කේ.කුමාරදාස මෙනවිය | කළමනාකරණ සේවා නිලධාරි | 40 |
| 07 | ජී.ඩී.එන්.පී.හෙන්නායක මිය | කළමනාකරණ සේවා නිලධාරි | 40 |
| 08 | ඩබ්.කේ.එච්.දසනායක මිය | පුස්තකාල සහයක | 40 |
| 09 | ටී.එම්.සී.එස්.දසනායක මිය | කා.කා.ස. | 40 |
| 10 | ටී.එස්.රුවන් කුමාර මයා | රියදුරු | 90 |
| 11 | පී.එච්.ඩී.ජී.තිලකරත්න මයා | රියදුරු | 60 |
| 12 | එච්.එම්.සමන් වික්‍රමතිලක මයා | මුරකරු | 75 |
| 13 | ලයනල් පද්ම කුමාර මයා | මුරකරු | 75 |
| 14 | කේ.ඩී.චන්ද්‍රපාල මයා | මුරකරු | 75 |
| 15 | ආර්.එම්.ආර්.රණතුංග මයා | විදුලි කාර්මික | 75 |
| 16 | ඉන්දික වීරසිංහ මයා | ආදාහනාගාර ක්‍රියාකරු | 75 |
| 17 | ඩබ්.ඒ.නන්දන සරත් කුමාර මයා | ආදාහනාගාර සහයක | 75 |
| 18 | එච්.පී.චන්දන සම්පත් | මාර්ග කම්කරු | 75 |
| 19 | ආර්.එස්.කලුආරච්චි මයා | මාර්ග කම්කරු | 60 |
| 20 | එස්.එම්.කුමාරසිංහ මයා | මාර්ග කම්කරු | 40 |
| 21 | එච්.ජී.ඩී.බණ්ඩාර මයා | මාර්ග කම්කරු | 56 |
| 22 | ජේ.සී.අයි.ජයතිලක මයා | මාර්ග කම්කරු | 75 |
| 23 | ඩබ්.එම්.යූ.විජේකෝන් මයා | මාර්ග කම්කරු | 40 |
| 24 | ජී.ජී.ඒ.අමරරත්න මයා | මාර්ග කම්කරු | 75 |
| 25 | එස්.අනෝජන් මයා | මාර්ග කම්කරු | 75 |
| 26 | බී.විනෝදන් මයා | මාර්ග කම්කරු | 75 |
| 27 | එස්.කමලනාදන් මයා | සෞඛ්‍ය කම්කරු | 60 |
| 28 | කේ.වෙල්මුරුගන් මයා | සෞඛ්‍ය කම්කරු | 40 |

| අ.අ | නම | තනතුර | ඉල්ලුම්කළ පැය ගණන |
|---|---|---|---|
| 29 | කේ.සෙල්වරාජා මයා | සෞඛ්‍ය කම්කරු | 40 |
| 30 | කේ.විශ්වනාදන් මයා | සෞඛ්‍ය කම්කරු | 40 |
| 31 | වි.යේසු මයා | සෞඛ්‍ය කම්කරු | 75 |
| 32 | ආර්.තර්මු මයා | සෞඛ්‍ය කම්කරු | 40 |
| 33 | වී.තෛවරාසා මයා | සෞඛ්‍ය කම්කරු | 40 |
| 34 | ඒ.එන්.කන්නන් මයා | සෞඛ්‍ය කම්කරු | 40 |

**දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරිමට**

| අ/අ | නම | තනතුර | ඉල්ලුම් කළ පැය ගණන |
|---|---|---|---|
| 1. | පී.ඒ.එස්. ප්‍රේමදාස මයා | කාර්යාල කාර්ය සහායක | 120 |
| 2. | එම්.එම්.ජී. ජයරත්න මයා | කාර්යාල කාර්ය සහායක | 120 |

**ගරු සභික D.U.G.N.B.දොඩම්වල මහතා**

එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සඳහා සංශෝධන හෝ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් එය සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කෙරින.

**සභා තිරණ අංක 2025/22**
**ගරු සභික H.M.කිත්සිරි හේරත් මහතා**

කාරක සභා 04 සඳහා බාහිර පාර්ශවය නියෝජනය කරමින් සාමාජිකයින් ලෙස පහත සඳහන් මහත්ම/මහත්මීන් සුදුසු බවට යෝජනා කරන ලදි.

- මුදල් හා ප්‍රතිපත්ති කමිටුව - රෝහණ සම්පත් දිසානායක මහතා
- නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව - ගාමිණී ජයවර්ධන මහතා
- කාර්මික සේවා කමිටුව - එම්.රිෆ්නාස් පරීඩ් මහතා
- පරිසර හා පහසුකම් කමිටුව - ස්වර්ණා කුමාරි දසානායක මහත්මිය

**ගරු සභික P.G.සන්ත දිසානායක මහතා**

එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සඳහා සංශෝධන හෝ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් එය සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කෙරින.

**සභා තිරණ අංක - 2025/23**
**ගරු සභික එච්.එම්.චමින්ද කුමාර විජේරත්න මහතා**

පළාත් පාලන කොමසාරිස්ගේ අංක NCP/LG/PL/02/18/Sntry –Fclty/2025 හා 2025.06.19 දිනැතිව ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ නාගරික ප්‍රදේශවල පොදු මහජනතාව හා සංචාරකයින් සඳහා සනීපාරක්ෂක පහසුකම් වැඩදියුණු කිරිමේ වැඩසටහන - 2025 යටතේ ක්‍රියාත්මක කිරිම සම්බන්ධව එවා ඇති ලිපියට අනුව

කැකිරාව ප්‍රාදේශීය සභාවට අයත්

- කැකිරාව කුඹුක සිසිල පරිශ්‍රයේ පවතින වැසිකිළි ද්විත්වය අලුත් වැඩියා කිරිම
- මඩාටුගම පොදු වැසිකිළිය නවීකරණය

යන සඳහා ඇස්තමේන්තු සකස් කර,අදාල ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් ක්‍රියාත්මක කිරිම සුදුසු බවට යෝජනා කරන ලදී.

**<u>ගරු සභික ඩී.යූ.ජී.එන්.බී.දොඩම්වල මහතා</u>**

එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සඳහා සංශෝධන හෝ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් යෝජනාව සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කෙරින.

**<u>සභා තිරණ අංක 2025/24</u>**

**<u>ගරු සභික, M.G.ප්‍රභාත් වීරසේන මහතා</u>**

පළාත් පාලන කොමසාරිස්ගේ අංක NCP/LG/AD/03/secretary(III) හා 2025.06.04 දිනැතිව යොමු කරන ලද ලිපියට අනුව

ධූර කාලය අවසන් පළාත් පාලන ආයතනවල ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය අනුව කාර්ය කර්තව්‍ය ඉටු කිරිම වෙනුවෙන් දීමනා ඉල්ලීමට අදාලව , මැතිවරණයක් පවත්වා ප්‍රාදේශීය සභා පිහිටුවන තුරු එම ආයතනවල රාජකාරි කරනු ලබන ප්‍රාදේශීය සභා ලේක්ම්වරුන් වෙත ගෙවනු ලබන මාසික දීමනාව රු. 20,000/- ක් දක්වා වැඩි කිරිමටත්, දැනට ගෙවන ලබන රු.1500/- ක දුරකථන දීමනාව රු.3000 /- ක (පළාත් භාණ්ඩාගර චක්‍රෙල්බ 06/2022 අදාල නොවේ)උපරිමයකට යටත්ව සභා අරමුදලින් ගෙවීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බැවින්, අදාල ගෙවීම් කටයුතු සිදු කිරිමට අවශ්‍ය කටයුතු සිදු කිරිම සුදුසු බවට යෝජනා කරන ලදී.

**<u>ගරු සභික M.K.A.J.S.අනුරුද්ධ ජයතිලක මහතා</u>**

එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සඳහා සංශෝධන හෝ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් එය සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කෙරින.

**<u>සභා තිරණ අංක - 2025/25</u>**

**<u>ගරු සභික ඩී.යූ.ජී.එන්.බී.දොඩම්වල මහතා</u>**

ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අංක NCP/CM/ED10(2025) හා 2025.06.20 දිනැතිව යොමු කරන ලද ලිපියට අනුව

අනුරාධපුර ඓතිහාසික ශ්‍රී දළදා පෙරහැර 2025.ජූලි මස 10 වන දින පැවැත්වෙන බැවින්, ඒ සඳහා මූල්‍ය අනුග්‍රාහකත්වය ලබා ගැනීමට අදාලව ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි රු.50,000/- ක මුදල ලබා ගැනීමට ඉල්ලීම් කර ඇත.ඒ සඳහා සභා අරමුදල් මගින් රු.50,000/- ක මුදලක් ලබා දීමට සුදුසු බවට යෝජනා කරන ලදී.

**<u>ගරු සභික M.H.ෆරුකාන් මහතා</u>**

එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සඳහා සංශෝධන හෝ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් යෝජනාව සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කෙරින.

**<u>සභා තිරණ අංක - 2025/26</u>**

**<u>ගරු සභික K.සබුරාන් මහතා</u>**

(EDOTCO Group Sdn Bhd) ඊඩොටිකෝ සර්විසස් ලංකා (පුද්) සමාගම ,අධ්‍යක්ෂ මෙහෙයුම්ගේ අංක ESLL/LMP/2025/LA/S/098 හා 2025 ජූනි මස 16 වෙනි දිනැතිව යොමු කරන ලද ලිපිය

කැකිරාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ දුරකථන හා අන්තර්ජාල සේවා ආවරණය වැඩි දියුණු කිරිම සඳහා බහුකාර්ය පහන් කණුවක් ස්ථාපිත කිරිම සම්බන්ධව කරන ලද ඉල්ලීමට අවසර ලබා දීමටත්, ඒ සඳහා මාසිකව රු.7500/ - ක ගාස්තු අයකිරිමට කටයුතු කිරිමටත් සුදුසු බවට යෝජනා කරන ලදී.

**<u>ගරු සභික එච්.එම්.චමින්ද කුමාර විජේරත්න මහතා</u>**

එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සඳහා සංශෝධන හෝ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් යෝජනාව සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කෙරින.

<u>සභා තීරණ අංක - 2025/27</u>

<u>ගරු සභික H.නවරත්න බංඩාර මහතා</u>

උමැප/කැකි/ප්‍රාස/05/01/02 හා 2025.06.25 දිනැතිව ආර්.තර්මු මයාගේ- ආපදා ණය ලබාදීම සම්බන්ධව යොමු කරන ලද ලිපිය

කැකිරාව ප්‍රාදේශිය සභාවේ සෞඛ්‍ය කම්කරු තනතුරේ සේවයේ නියුතු ආර්.තර්මු මයා විසින් ආපදා ණය ලබා ගැනීම සඳහා ඉල්ලීම් කර ඇති අතර, ඔහුගේ ශේෂ මුදල වන රු. 239,330/- ක මුදල ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>ගරු සභික M.M.කුමාරසිංහ බංඩා මහතා</u>

එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සඳහා සංශෝධන හෝ විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් යෝජනාව සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කෙරින.

<u>ගරු සභාපති සිදත් චාමර බණ්ඩාර මුදියන්සේ මහතා</u>

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, දිස්ත්‍රික් කළමණාකරුගේ අංක 24/03/02/16 දිනැතිව යොමු කරන ලද ලිපිය - පොදු ඉඩමේ අනවසරයෙන් නිවසක් ඉදි කිරිමට අදාලව

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පූර්ණ අයිතිය පවතින අත්තම් නිවාස ක්‍රමයේ කැබලි අංක 536 දරණ පොදු ඉඩම තුල ධනුෂ්කා මිලානි යන අයෙකු විසින් නිවසක් ඉදිකර පදිංචිව සිටින බවත්, එම ඉඩම් කොටස (පර්චස් 10 ක් පමණ ) පොදු බවින් ඉවත් කර, ඉතිරි කොටස පොදු කටයුතු සඳහා යොදා ගැනීමටඅවශ්‍ය ඒ සඳහා අනුමතියක් ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇති බව පවසා සිටින ලදී.

<u>ගරු සභික, M.G.ප්‍රභාත් වීරසේන මහතා</u> මේ සම්බන්ධව පරීක්ෂාවක් සිදු නොකර තීරණයක් ගත නොහැකි බැවින් ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කර , එම වාර්තාවට අදාලව ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බව පවසා සිටින ලදී.

එමෙන්ම කාරක සභා සඳහා සාමාජිකයින් පත්කිරිමේ දී සාමාන්‍යයෙන් කමිටුවක සාමාජිකයින් ඔත්තේ සංඛ්‍යාවක් විය යුතු බැවින් , මේ සඳහා පත්කර ගන්නා ලද කමිටුවලට අදාලව එක් එක් කමිටුව සඳහා තවත් එක් සාමාජිකයෙකු පත් කර ගත යුතුව ඇති බැවින් ,ඒ සඳහා සාමාජිකයෙකු පත් කිරිමට සභාවට ඉදිරිපත් කරන ලදී.

<u>තීරණ අංක 2025/28</u>

<u>ගරු සභික P.G.සන්ත දිසානායක මහතා</u>

පහත පරිදි සාමාජිකයින් පත් කිරිම සුදුසු බවට යෝජනා කරන ලදී.

- මුදල් හා ප්‍රතිපත්ති කමිටුව - ගරු සභික H.M.කිත්සිරි හේරත් මහතා
- නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව - ගරු සභික M.M.කුමාරසිංහ බංඩා මහතා
- කාර්මික සේවා කමිටුව - ගරු සභික D.D.විජේසිංහ මහතා
- පරිසර හා පහසුකම් කමිටුව - ගරු සභික S.ජෙගදීසන් මහතා

<u>ගරු සභික H.නවරත්න බංඩාර මහතා</u>

එම යෝජනාව ස්ථිර කරන ලදී.

ඉහත යෝජනාව සම්මත වූ බව ගරු සභාපතිතුමා විසින් නිවේදනය කෙරින.

(ඉ) කාරක සභා වාර්තා සහ එම වාර්තා එවලේම සලකා බැලීමට ප්‍රාදේශීය සභාව තීරණය කරන්නේ නම් මිස ඒවා සලකා බැලීම සඳහා දිනයක් නියම කිරිම

**<u>කැකිරාව ප්‍රාදේශීය සභාවේ 2025.06.16 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාව</u>**

මෙහිදි ගරු සභාපතිතුමා විසින් කමිටුව වෙත පැවරෙන කාර්යයන් සම්බන්ධවද දැනුවත් කරන ලදී

**<u>තීරණ අංක 2025/29</u>**
**<u>ගරු සභාපති සිදත් චාමර බණ්ඩාර මුදියන්සේ මහතා</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 (1) යටතේ මුදල හා ප්‍රතිපත්ති කමිටුව සඳහා පහත සඳහන් විෂයයන් 18 යටතේ පූර්ණ බලය පවරන අතර, මෙම කමිටුව විසින් කළ යුත්තේ මහ සභාවට නිර්දේශ ඉදිරිපත් කිරිම නොව මහ සභාව වෙනුවෙන් අදාල කාරණය ගැන අවශ්‍ය තීරණයක් ගෙන ඒ බැව් මහ සභාවට දැන්වීමයි.මෙම කරුණු සඳහන් යෝජනාව ක්‍රියාත්මක කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

**මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කමිටුව සඳහා පැවරෙන විෂයයන්**

1.ප්‍රාදේශීය සභා අරමුදල් පවත්වාගෙන යාම

2.ආදායම් එකතු කිරිම හා ආදායම් මාර්ග ඇති කිරිම

3.අක්කර බදු වෙනත් ආදායම් පැනවීම අයකර ගැනීම

4.බල පත්‍ර ගාස්තු අයකර ගැනීම පැවරීම

5.වාර්ෂික අයවැය ලේඛනය හා පරිපූරක අයවැය ලේඛනය සැකසීම

6.අවශ්‍යතාව පරිදි ණය ලබා ගැනීම

7.සභාවේ සමස්ථ මුදල් කළමනාකරණය හා අවශ්‍යතාව පරිදි මුදල් ආයෝජනය

8.සභාවට සිදු වී ඇති අලාභ පාඩු අධිභාර කර ඇති වියදම් අයකර ගැනීම හා නීත්‍යානුකූල වන්දි ගෙවීමට කටයුතු කිරිම

9.සභාවේ සමස්ථ ආදායම විධිමත් ලෙස ගිණුම් පොත්වලට ඇතුලත් කොට පවත්වාගෙන යාම හා ගිණුම් පද්ධතිය යාවත්කාලීන කිරිම

10.සභාවේ දැනටමත් අතිකාල සේවය ලබාගෙන කරගෙන යනු ලබන වැඩ පිළිවෙල ගැඹුරින් නිරික්ෂණය කර වඩාත් ඵලදායි ලෙස සේවයේ , සේවකයින් යෙදවීමට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරිම

**ප්‍රතිපත්ති සැකසීම**

11.සංවර්ධන සැලසුම් සකස් කිරිම හා ක්‍රියාත්මක කිරිම

12.අවශ්‍යතාවය පරිදි අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම

13.මානව සංවර්ධන සම්පත් ඇති කිරිම

14.රැකියා වැඩපිළිවෙලවල් සංවිධානය කිරිම

15.වෘත්තිය හා පුහුණුවීම් සම්බන්ධව ක්‍රියා කිරිම .

16.සේවා අවශ්‍යතාව පරිදි ඉඩම් , ගොඩනැගිලි,යන්ත්‍ර ,උපකරණ ලබා ගැනීම සඳහා තීරණය කිරිම

17.පිරිස් පාලනය

18.සභාවට පැවරී ඇති කාර්යභාරය සැලකිල්ලට ගෙන තනතුරු ඇති කිරිම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරිම

**<u>සභා තිරණ අංක - 2025/30</u>**
අයි.එම්.ජී.බී.ඉලංගසිංහ මහතා, ක්‍රිකට් පුහුණු කරු, ශාස්ත්‍රවෙල්ලිය, කැකිරාව විසින් ක්‍රිකට් පුහුණු කිරිම සඳහා ක්‍රීඩා පිටිය ලබා ගැනීම සම්බන්ධව යොමු කරන ලද ලිපියට අනුව,2025 වර්ෂයේ ඉදිරි මාස 06 සඳහා ජලය හා විදුලිය භාවිතා කරන බැවින්, කොන්දේසී ඇතුලත් කර , රු. 15,000 /- ක මුදලකට ලබා දීමට සුදුසු බවට ගරු තීරණය විය.

**සභා තීරණ අංක - 2025/31**

ප්‍රාදේශීය ලේකම්,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පලුගස්වැව විසින් මැනුම් ගාස්තු දැනුම් දීම සම්බන්ධව යොමු කරන ලද ලිපියට අනුව ,කැකිරාව ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් ස්ථාන පවරා ගැනීමට මැනුම් කටයුතු සිදු කිරිම සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති මැනුම් ගාස්තු ගෙවීමටත්, ප්‍රාදේශීය ලේකම් විසින් දැනුවත් කර ඇති බැවින් ,අදාල ගාස්තු ගෙවිමට මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති මැනුම් ගාස්තු ගෙවීමට කටයුතු කිරිම සුදුසු බවට කමිටුව විසින් තීරණය විය.

- ප්‍රාදේශීය ලේකම්ගේ අංක PGW/LND/5/5/4/28 හා 2025/05/28 දිනැති ලිපිය- හබරණ පුස්තකාලය පිහිටි ඉඩම - මැනුම් ගාස්තු - රු. 36.000/- වැට් 18% රු. 6480.00 -එකතුව - රු.42,480.00

- ප්‍රාදේශීය ලේකම්ගේ අංක PGW/LND/5/5/4/35 හා 2025/05/28 දිනැති ලිපිය- පලුගස්වැව පොදු වැසිකිළිය පිහිටි ඉඩම - මැනුම් ගාස්තු - රු. 36.000/- වැට් 18% රු. 6480.00 -එකතුව - රු.42,480.00

- ප්‍රාදේශීය ලේකම්ගේ අංක PGW/LND/5/5/4/36 හා 2025/05/28 දිනැති ලිපිය- පලුගස්වැව උප කාර්යාලය පිහිටි ඉඩම - මැනුම් ගාස්තු - රු. 36.000/- වැට් 18% රු. 6480.00 -එකතුව - රු.42,480.00

- ප්‍රාදේශීය ලේකම්ගේ අංක PGW/LND/5/5/4/37 හා 2025/05/37 දිනැති ලිපිය - කාශ්‍යපගම ක්‍රීඩා පිටිය පිහිටි ඉඩම - මැනුම් ගාස්තු - රු. 18,698.71 වැට් 18% රු. 3365.76 -එකතුව - රු.42,480.00

- ප්‍රාදේශීය ලේකම්ගේ අංක PGW/LND/5/5/4/39 දරණ ලිපිය - වායා උල්පත ගබඩාව පිහිටි ඉඩම -මැනුම් ගාස්තු - රු. 36,6515.64/- වැට් 18% රු. 6515.64 එකතුව - රු.42,713.64

**03** .නියෝජ්‍ය අධ්‍යක්ෂ , වයඹ සංවර්ධන අධිකාරිය විසින් (මගුරු ඔය වත්ත, මල් කඩුවාව බෝගනේ ලිපිනය) Cat 2020 මෘදුකාංගය සඳහා සේවා ගිවිසුම්ගත වීම සම්බන්ධව යොමු කර ඇති ලිපිය

**සභා තීරණ අංක - 2025/32**

වයඹ පළාත් සභාවේ වයඹ සංවර්ධන අධිකාරිය විසින් දිවයිනේ පළාත් පාලන ආයතන සඳහා මේ වන විට ස්ථාපිත කර පවත්වාගෙන යනු ලබන Cat 2020 මෘදුකාංගය සඳහා සේවා ගිවිසුම්ගත වීම සම්බන්ධව ගෙවීම් කළ යුතුව ඇති බැවින් ,දක්වා ඇති කාල සීමාවන්ට අදාලව ඉදිරිපත් කර ඇති මුදල් ගෙවීම සුදුසු බවට තීරණය විය.

01.ගිවිසුම් කාලය - 2024.03.15 සිට 2025.12.31 දක්වා

02.මුදල් ගෙවීම - 2024.03.15 සිට 2024.12.31 දක්වා රු. 210,000.00

-2025.01.01 සිට 2025.12.31 දක්වා රු. 280,000.00

**සභා තීරණ අංක - 2025/33**

මල්දෙණිපුර ශ්‍රී විසුද්ධාරාම විහාරය විසින් වාර්ෂිකව පවත්වන ලද මිහිඳු පෙරහැර සඳහා ප්‍රාදේශීය සභාව මගින් කඩල දන්සැලක් පවත්වන ලද අතර, ඒ සඳහා පරිත්‍යාග වශයෙන් මුදලින් හා ද්‍රව්‍යමය ලෙස ආධාර

ලබාදුන් අතර, ඉතිරි රු. 32.550 /- ක මුදල සඳහා සභා අරමුදල් මගින් දායකත්වය ලබා දීමට සුදුසු බවට තීරණය විය.

06.2025 වර්ෂයේ මැයි මස ආදායම් වියදම් වාර්තාව ( එල්.ජී.06 සහ එල්.ජී.13 වාර්තාව)

**සභා තිරණ අංක - 2025/34**

කැකිරාව ප්‍රාදේශීය සභාවේ මැයි මාසයට අදාලව ආදායම් වියදම් වලට අදාල වාර්තා ඉදිරිපත් කර ඇති අතර, ඒ පිළිබඳව සාකච්ඡා කර අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරිම සුදුසු බවට තීරණය විය..

**කැකිරාව ප්‍රාදේශීය සභාවේ 2025.06.16 වන දින පැවති කාර්මික සේවා කමිටු රැස්වීම් වාර්තාව**

මෙහිදී ලැබී ඇති ලිපි කිසිවක් නොමැති බැවින්, ගරු සභාපති තුමා විසින් කමිටුව වෙත පැවරෙන කාර්යයන් සම්බන්ධවද දැනුවත් කරන ලද අතර, 2025 වර්ෂයේ ජනවාරි මස සිට ජුනි මස දක්වා ආරම්භ කර ක්‍රියාත්මක ව්‍යාපෘති සම්බන්ධව පැහැදිලි කරන ලදී.

**සභා තිරණ අංක - 2025/35**
**ගරු සභාපති සිදත් චාමර බණ්ඩාර මුදියන්සේ මහතා**

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 12 (1) යටතේ කාර්මික සේවා කමිටුව සඳහා පහත සඳහන් විෂයයන් 06 යටතේ පූර්ණ බලය පවරන අතර, මෙම කමිටුව විසින් කළ යුත්තේ මහ සභාවට නිර්දේශ ඉදිරිපත් කිරිම නොව මහ සභාව වෙනුවෙන් අදාල කාරණය ගැන අවශ්‍ය තීරණයක් ගෙන ඒ බැව් මහ සභාවට දැන්වීමයි.මෙම කරුණු සඳහන් යෝජනාව ක්‍රියාත්මක කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

**කාර්මික සේවා කමිටුව සඳහා පැවරෙන කාර්යයන්**

1.1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය ප්‍රකාර පාරවල් ප්‍රකාශනයට පත් කිරිමට අවශ්‍ය වන නිර්දේශ ඉදිරිපත් කිරිම හා සැලැස්ම ඉදිරිපත් කිරිම

2.සභා බල ප්‍රදේශයේ පවත්නා පාරවල් වල විථී හා ස්මාරක නම් කිරිමේ පනතට අදාලව නිර්දේශ ඉදිරිපත් කිරිම

3.වීථි ලාම්පු අලුත්වැඩියාව නඩත්තු කිරිම හා පවත්වාගෙන යාමේ දී අධීක්ෂණය කර දැනට පවතින ක්‍රමවේදය සම්බන්ධව වඩාත් ඵලදායි ක්‍රමවේදයක් පිළියෙල කර ඉදිරිපත් කිරිම

4.මං මාවත් පාරවල්, පාලම් වැඩිදියුණු කිරිම, නඩත්තු කිරිම , ආරක්ෂා කිරිම සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරිම

5.සියළුම පාරවල් විධිමත්ව නඩත්තු කර පවත්වාගෙන යාමට අවශ්‍ය වන දීර්ඝකාලීන සැලැස්මක් ඉදිරිපත් කිරිම

6.මාර්ග නඩත්තු ඒකකයක් පවත්වාගෙන යාමට අවශ්‍ය වන ව්‍යාපෘති වාර්තාවක් සකස් කර ඉදිරිපත් කිරිම

- නඩත්තු ප්‍රතිපාදන
- පළාත් නිශ්චිත ප්‍රධාන
- සභා අරමුදල්

නඩත්තු ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති

| **ව්‍යාපෘතියේ නම** | ඇස්තමේන්තු මුදල |
|---|---|
| අංක 628 කැකිරාව නගරයේ සෙක්කුපිටිය මාර්ගය තාර දමා සංවර්ධනය කිරිම | 4,000,000.00 |

| | |
|---|---|
| 638 සෙම්බුකුලිය තුලානේ ඒ් නමය මාර්ගය සෙම්බුකුලිය තිබ්බටුවැව විද්‍යාලය අසලින් ඔලොම්බෑව දක්වා මාර්ගය සංවර්ධනය | 3,000,000.00 |
| 641 මහඇලගමුව ආරියවංශ මහතාගේ කඩය අසල සිට පාලම දක්වා දිවෙන මාර්ගය සංවර්ධනය | 2,000,000.00 |
| 653 කණ්ඩලම බටහිර කිතුල්හිටියාව සිට උඩගම කොළණිය හරහා හැවැන්තැන්නේගම පාසල දක්වා දිවෙ මාර්ගය සංවර්ධනය | 2,000,000.00 |
| එම් බී දයාරත්න මහතාගේ කඩේ අසල සිට ප්‍රජා ශාලාව දක්වා ගමේ ප්‍රධාන මාර්ගය කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම - අදියර 01 | 3,000,000.00 |
| කැකිරාව පිළිසරු මධ්‍යස්ථානයේ කොම්පොස්ට් අංගනය පුළුල් කිරීම සහ කාණු පද්ධතිය සකස් කිරීම හා පූතික ටැංකි ඉදි කිරීම | 5,000,000.00 |
| කැකිරාව ඇඹුල්ගස්වැව අලිවැට සකස් කිරීම | 1,500,000.00 |
| හබරණ දඹුල්ල ප්‍රධාන මාර්ගයේ සිට හිරිවඩුන්න වැවට යන මාර්ගය සපත්තු පාලමක් සහ පැති කාණු සහිතව කොන්ක්‍රීට් දමා ප්‍රතිසංස්කරනය කිරීම | 2,000,000.00 |
| මරදන්කඩවල මහජන පුස්තකාලයේ පාඨක පුවත්පත් කියවීම සඳහා තාවකාලික අව්වැසි ආවරණයක් ඉදි කිරීම | 2,000,000.00 |
| මරදන්කඩවල නගරයේ පොදු වැසිකිළියක් ඉදි කිරීම | 3,000,000.00 |
| කැකිරාව මහජන පුස්තකාලය නවීකරණය | 1,150,000.00 |

| **ව්‍යාපෘතියේ නම** | ඇස්තමේන්තු මුදල |
|---|---|
| 597 මඩවල එප්පාවල හන්දියේ සිට ආසිරිගම දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | 1,500,000.00 |
| දඹුල්ල කැකිරාව මාර්ගයේ ඉහළගම හන්දියේ සිට 102/D1/T3 කෙත් ඇල පාර එස් ජී එම් ගාමිණී බණ්ඩාර මහතාගේ නිවස දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | 500,000.00 |
| කැකිරාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සෘජු ශ්‍රමය යටතේ මාර්ග නඩත්තුව | 3,000,000.00 |

- පළාත් නිශ්චිත ප්‍රධාන

| **ව්‍යාපෘතියේ නම** | ඇස්තමේන්තු මුදල | ගිවිසුම්ගත සංවිධානය | ගිවිසුම්ගත මුදල |
|---|---|---|---|
| 597 මඩවල එප්පාවල හන්දියේ සිට ආසිරිගම දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | 1,500,000.00 | මහසෙන් ගොවි ංවිධානය,කුඹුක්වැව,හබරණ | 1,500,000.00 |
| දඹුල්ල කැකිරාව මාර්ගයේ ඉහළගම හන්දියේ සිට 102/D1/T3 කෙත් ඇල පාර එස් ජී එම් ගාමිණී බණ්ඩාර මහතාගේ නිවස | 500,000.00 | 102/D1-D1A ගොවි සංවිධානය,නෙල්බෑගම,මඩාටු | 500,000.00 |

| | | | |
|---|---|---|---|
| දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | | ගම. | |
| කැකිරාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සෘජු ශ්‍රමය යටතේ මාර්ග නඩත්තුව | 3,000,000.00 | | |

- සභා අරමුදල්

| ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘතිය සඳහා අනුමත කරන මුදල (රු.) |
|---|---|
| ප්‍රාදේශීය සභා භූමිය ආවරණය කිරීම සඳහා ඉතිරි වී ඇති තාප්පයේ වැඩ නිම කිරීම. | 1,289,369.00 |
| දේශීය සභාවට අයත් ආයුර්වේද මධ්‍යස්ථානයේ දැල් වැට හා ගේට්ටුව ඉදි කිරීම. | 1,000,000.00 |
| කොරසගල්ල පාරේ සපත්තු පාලමේ කොටසක් ඉදප කිරීම. | 377,989.05 |

**<u>සභා තීරණ අංක - 2025/36</u>**

ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීම් විශාල ලෙස පවතින බැවින්, 638 සෙම්බුකුලිය තුලානේ ජ්ා නමය මාර්ගය සෙම්බුකුලිය තිබ්බටුවැව විද්‍යාලය අසලින් ඔලොම්බෑව දක්වා මාර්ගය බොරළු දමා සංවර්ධනය කිරීම සුදුසු බවට තීරණය විය.

**<u>සභා තීරණ අංක - 2025/37</u>**

මරදන්කඩවල මහජන පුස්තකාලයේ පාඨක පුවත්පත් කියවීම සඳහා තාවකාලික අව්වැසි ආවරණයක් ඉදි කිරීම_ව්‍යාපෘතියේ ප්‍රතිපාදිත මුදල රු. 2,000,000.00 වන අතර, එහි සම්පූර්ණ වැඩ නිම කිරීම සඳහා සභා අරමුදල් මඟින් රු. 1552517.43 ක මුදලක් යෙදිය යුතුව ඇති බැවින්, සභා අරමුදල් මඟින් වෙන් කිරීමට සුදුසු බවට තීරණය විය.

**<u>සභා තීරණ අංක - 2025/38</u>**

කැකිරාව මහජන පුස්තකාලය නවීකරණය කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රතිපාදිත මුදල රු. 1,150,000.00 වන අතර, එහි සම්පූර්ණ වැඩ නිම කිරීම සඳහා එම මුදල ප්‍රමාණවත් නොමැති බැවින්, සභා අරමුදල් මඟින් 1552517.43 ක මුදලක් යෙදිය යුතුව ඇති අතර, ව්‍යාපෘතිය සඳහා සභා අරමුදල් මඟින් එය ගෙවීම් කිරීමට සුදුසු බවට තීරණය විය.

**<u>සභා තීරණ අංක - 2025/39</u>**

සභාවේ පවතින වාහනවල ආරක්ෂාව සඳහා රථ ගාලක් ඉදි කිරීමටත්, ජෙනරේටරය සඳහා ආරක්ෂිත ආවරණ කුටියක් සකස් කිරීමට සුදුසු බවට තීරණය විය.

**<u>කැකිරාව ප්‍රාදේශීය සභාවේ 2025.06.19 වන දින පැවති ප්‍රජා සංවර්ධන කමිටු රැස්වීම් වාර්තාව</u>**

2025 වර්ෂය සඳහා සකස් කරන ලද ප්‍රජා සංවර්ධන සැලැස්ම හා එහි වැඩසටහන් සම්බන්ධව විෂය නිලධාරිනිය විසින් හඳුන්වා දෙන ලද අතර, 2025 ජනවාරි මස සිට ජූනි මස දක්වා සිදු කරන ලද වැඩසටහන් හා එහි ප්‍රගතිය පිලිබඳව ද දැනුවත් කරන ලදී. එමෙන්ම ජූලි මාසය තුල ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන් සඳහා අනුමැතියට ඉදිරිපත් කරන ලදී. එමෙන්ම ගරු සභාපතිතුමා විසින් කමිටුව වෙත පැවරෙන කාර්යයන් සම්බන්ධව දැනුවත් කරන ලදී.

**<u>සභා තීරණ අංක - 2025/40</u>**

**<u>ගරු සභාපති සිදත් චාමර බණ්ඩාර මුදියන්සේ මහතා</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 12 (1) යටතේ නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව සඳහා පහත සඳහන් විෂයයන් 09 යටතේ පූර්ණ බලය පවරන අතර, මෙම කමිටුව විසින් කළ යුත්තේ මහ සභාවට නිර්දේශ ඉදිරිපත් කිරිම නොව මහ සභාව වෙනුවෙන් අදාල කාරණය ගැන අවශ්‍ය තීරණයක් ගෙන ඒ බැව් මහ සභාවට දැන්වීමයි.මෙම කරුණු සඳහන් යෝජනාව ක්‍රියාත්මක කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

**නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව සඳහා පැවරෙන කාර්යයන්**

1. නිවාස යෝජනා ක්‍රම පවත්වාගෙන යාම

2. වෙනත් සමාගම් සමඟ මැදිහත් වී නිවාස ඉදි කිරිම වැඩි දියුණු කිරිම සඳහා කටයුතු කිරිම

3. ආගමික කටයුතු උත්සව සංවිධානය කිරිම

4. දහම් පාසල් , ශාසන ආරක්ෂක බල මණ්ඩල ,පුස්තකාල ,සංස්කෘතික කටයුතු නාට්‍ය , කලා උත්සව සංවිධානය කිරිම සඳහා පහසුකම් සලසා දීම මහ පෙන්වීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරිම

5. ක්‍රීඩා පහසුකම් ප්‍රජා මණ්ඩල ඇති කිරිම

6. කාන්තා ස්වයං රැකියා ඇති කිරිම

7. දැනට තිබෙන අතුරු ව්‍යවස්ථා නිරික්ෂණයට භාජනය කර පුස්තකාල වඩාත් ඵලදායි ලෙස පවත්වාගෙන යාමට නිර්දේශ ඉදිරිපත් කිරිම

8. දුගී,දුප්පත් ජනතාවට සහනාධාර සැලසීම සඳහා අසරණ තැනත්තන් සහ කායිකව ,මානසිකව හෝ සාමාජික වශයෙන් ආබාධිත තැනැත්තන් පුනරුත්ථාපනය කිරිම සඳහා ප්‍රාදේශිය සභා අරමුදලින් යම් කොටසක් වියදම් කිරිම පිණිස අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරිම

9. පළාත් පාලන ප්‍රතිසංසකරණ චක්‍රලේඛන අතුරින් නිවාස හාප්‍රජා සංවර්ධනයට අදාල වන නිර්දේශ හා උපදෙස් සලකා බලා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරිම

10. පහසුකම් කාර්යයන් මෙම කමිටුවකට පැවරීමට වැඩිදුරටත් යෝජනා කරමි.මෙම කමිටුවට සභාපති වරයෙක් ඇතුළුව 07 දෙනෙකු යෝජනා කර ගැනීමට යෝජනා කරමි.

**සභා තිරණ අංක - 2025/41**

01.බල ප්‍රදේශය තුල පවතින පෙර පාසල් ගුරුවරුන් සඳහා අප ද්‍රව්‍ය කලමනාකරණය කිරිම සම්බන්ධ දැනුවත් කිරිමේ වැඩසටහනක් පැවැත්වීම

02. කැකිරාව මහජන පුස්තකාලෙයේ පාඨක සමාජය විසින් දිනන මුතු නමින් ත්‍රෛමාසික සඟරාවක් එළි දැක්වීමට කටයුතු කිරිම

03.බල ප්‍රදේශය තුල තෝරා ගත් පාසල් කීපයක් සම්බන්ධ කර ගනිමින් ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක් පැවැත්වීම

04.මහජන පුස්තකාල කාර්යය මණ්ඩලය සඳහා පොත් බැඳීමේ පුහුණු වැඩසටහනක් පැවැත්වීම

05.කැකිරාව ආයුර්වේදය මඟින් වාර්ෂිකව කාර්තුවලට අදාලව ජංගම සායන වැඩසටහනක් පැවැත්වීම

2025 වර්ෂය තුල ඉදිරි කාල සීමාව තුල ඉදිරිපත් කර ඇති මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරිමටත්, අවශ්‍යතාවය මත ප්‍රමුඛතාවය අනුව සම්පත්දායකයින් ද සම්බන්ධ කර ගැනිමින් ඉහත වැඩසටහන් ක්‍රියාත්මක කිරිම සුදුසු බවට තීරණය විය.

**කැකිරාව ප්‍රාදේශිය සභාවේ 2025.06.19 වන දින පැවති පරිසර හා පහසුකම් කමිටුව මඟින් ගන්නා ලද තිරණ**

ගරු සභාපතිතුමා විසින් කමිටුව වෙත පැවරෙන කාර්යයන් සම්බන්ධව දැනුවත් කරන ලදී.2025 වර්ෂය සඳහා සකස් කරන ලද පරිසර සන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම හා එහි වැඩසටහන් සම්බන්ධව විෂය නිලධාරි විසින් හඳුන්වා දීමක් සිදු කරන ලද අතර, 2025 ජනවාරි මස සිට ජූනි මස දක්වා සිදු කරන ලද වැඩසටහන්

පිලිබඳව ද සමාලොචනයක් සිදු කරන ලදී. එමෙන්ම ජූලි මාසය තුල ක්‍රියාත්මක කිරිමට යෝජිත වැඩසටහන් සඳහා අනුමැතියට ඉදිරිපත් කරන ලදී. එ් අනුව

**<u>සභා තිරණ අංක - 2025/42</u>**

**<u>ගරු සභාපති සිදත් චාමර බණ්ඩාර මුදියන්සේ මහතා</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 12 (1) යටතේ පරිසර හා පහසුකම් කමිටුව සඳහා පහත සඳහන් විෂයයන් 11 යටතේ පූර්ණ බලය පවරන අතර, මෙම කමිටුව විසින් කළ යුත්තේ මහ සභාවට නිර්දේශ ඉදිරිපත් කිරිම නොව මහ සභාව වෙනුවෙන් අදාල කාරණය ගැන අවශ්‍ය තීරණයක් ගෙන ඒ බැව් මහ සභාවට දැන්වීමයි.මෙම කරුණු සඳහන් යෝජනාව ක්‍රියාත්මක කිරිම සුදුසු බවට මම යෝජනා කරමි.

**පරිසර හා පහසුකම් කමිටුව සඳහා පැවරෙන කාර්යයන්**

1.මහජන සෞඛ්‍ය පානීය ජලය හා ජල සම්පාදන ජලාපවහන සහ කසල ශෝධනය කිරිම
2.පොදු නාන ස්ථානය ඇති කිරිම හා ඒවා විධිමත් කිරිම
3.වැසිකිළි පහසුකම් ලබා දීම
4.සෞඛ්‍ය අහිතකර ස්ථාන පිළිබඳ සොයා බැලීම
5.පොදු කාණු විධිමත් කිරිම පිළිබඳ සොයා බැලීම
6.ආහාර ද්‍රව්‍ය අළෙවි කරන ස්ථාන විධිමත් කර දැනට තියෙන අතුරු ව්‍යවස්ථාව පරිශීලනය කර ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයට ගැලපෙන අතුරු ව්‍යවස්ථා පිළියෙල කිරිම
7.මැලේරියාව ,ඩෙංගු මදුරු උවදුරු අවම කිරිම හා උපදෙස් ලබා දීම /නිර්දේශ කිරිම සඳහා අතුරු ව්‍යවස්ථා පිළියෙල කිරිම
8.පොදු සුසාන භූමි සියල්ලම ප්‍රකාශයට පත් කිරිම සඳහා අවශ්‍ය සියළු වැඩපිළිවෙල වල් සකස් කර ප්‍රකාශයට පත් කිරිම
10.පවත්වාගෙන යනු ලබන පොදු වෙළඳපොලවල් පවත්වාගෙන යාම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරිම,නව වෙළඳපොලවල් පවත්වාගෙන යාම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරිම
11.කසල එකතු කිරිම සම්බන්ධව ,කසල බැහැර කිරිමේ ක්‍රමවේදය හා ඊට අදාල කරනු ලබන විධාන වල ක්‍රියාකාරීත්වය ඇතුළුව දැනට පවතින තත්වය නිරික්ෂණය කර වඩාත් ඵලදායි සහ කාර්යක්ෂම ක්‍රමවේදයක් ඉදිරිපත් කිරිම

**<u>සභා තිරණ අංක - 2025/43</u>**

සැම මසකම ඩෙංගු මර්ධන වැඩ සටහන් 02 ක් සිදු කිරිමට සැලසුම්කර ඇති බැවින් , එය ක්‍රියාත්මක කිරිම සුදුසු බවට තීරණය විය. (ජූනි මස - 23 -පොදු වෙළඳපොල - කැකිරාව /ජූලි මස - කැකිරාව නගරය, මරදන්කඩවල)

අපද්‍රව්‍ය කළමනාකරණ කමිටු රැස්වීම ජූලි මස පැවැත්වීම

**<u>සභා තිරණ අංක - 2025/44</u>**

**<u>ගරු සභාපති සිදත් චාමර බණ්ඩාර මුදියන්සේ මහතා</u>**

අපද්‍රව්‍ය කළමනාකරණ කමිටු රැස්වීම

ජූලි මස පැවැත්වීමට සැලසුම් කර ඇති අපද්‍රව්‍ය කළමනාකරණ කමිටු රැස්වීම රාජ්‍ය ආයතන හා වෙළඳසංගම් එකතු කර ජූලි මස 15 වන දින පෙ.ව. 10 .00 ට පැවැත්වීමටත්,එය ලිඛිතව දැනුවත් කිරිම සුදුසු බව තීරණය විය.

**<u>සභා තිරණ අංක - 2025/45</u>**

2025 වර්ෂය තුල පරිසර සන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්මට අනුව ක්‍රියාත්මක කිරිමට සැලසුම් කර ඇති පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට කටයුතු කිරිම සුදුසු බවට තීරණය විය.

- (සෞඛ්‍ය සේවකයින් වෙනුවෙන් සෞඛ්‍ය සායනයක් පැවැත්වීම

- ජුනි මස තුල - ( සෙනසුරාදා දිනයක් කැකිරාව තුල සිදු කිරිමට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි විසින් පවසා ඇත.)
- ජූලි පළමු සතිය කාර්යාල පරිශ්‍රය පිරිසිදු කිරිම (ශ්‍රමදාන වැඩසටහනක්)
- අපද්‍රව්‍ය ඒකක කමිටු රැස්වීම ( ජුනි මස 25 වන දින)
- අප ද්‍රව්‍ය කළමනාකරණ කටයුතු විධිමත් කිරිම සඳහා යෝජනා

එ් අනුව සභා තීරණ අංක 2025/29 සිට 2025/34 දක්වා වූ සභා තීරණ ඇතුලත් මුදල් හා ප්‍රතිපත්ති කමිටු රැස්වීම් වාර්තාවත්,අංක 2025/35 සිට 2025/39 දක්වා වූ සභා තීරණ ඇතුලත් කාර්මික සේවා කමිටු රැස්වීම් වාර්තාවත්,අංක 2025/40 සිට 41 දක්වා වූ තීරණ ඇතුළත් ප්‍රජා සංවර්ධන රැස්වීම් කමිටු වාර්තාවත් ,අංක 2025/42 සිට 2025/45 දක්වා වූ පරිසර හා පහසුකම් කමිටු රැස්වීම් වාර්තාවත් **ගරු සභික A.A.ලයනල් මහතාගේ හා ගරු සභික P.G.සන්ත දිසානායක මහතාගේ යෝජනා ස්ථීරත්වයෙන්** සභා සම්මත විය.

(ඊ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ ,එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරිමට වෙනත් ලේඛන ඉදිරිපත් කිරිම සහ සලකා බැලීම

ලේකම්තුමිය විසින් 2025 මැයි මස ආදායම් වියදම් වාර්තාව ගරු සභාවට ඉදිරිපත් කරන ලද අතර,

**සභා තීරණ අංක - 2025/46**

කැකිරාව ප්‍රාදේශීය සභාවේ 2025 මැයි මස ලැබීම් සාරාංශයට අනුව මුලු ලැබීම් මුදල රු. 8,770,669.72ක් වන අතර,ගෙවීම් සාරාංශයට අනුව මුළු ගෙවීම් මුදල රු. 13,119,922.06 ක් වූ අතර, එම ආදායම් වියදම් වාර්තාව සම්මත විය.

| **2025 මැයි මස ආදායම් ලැබීම් සාරාංශය** | | |
|---|---|---|
| ආදායම් සංකේත | ආදායම් විස්තරය | මුළු ලැබීම් |
| 4100 | වරිපනම් හා බදු | 650,152.20 |
| **4200** | කුලී | 1,885,230.62 |
| | බලපත්‍ර ගාස්තු | 230,300.00 |
| **4400** | සේවා ගාස්තු | 306,519.00 |
| **4500** | වරෙන්තු සහ අධිභාර | 4,678.75 |
| **4600** | වෙනත් විකුණුම් ආදායම් | 26,943.00 |
| **4700** | පොලී ආදායම | 44,712.44 |
| **4800** | විවිධ ආදායම් | - |
| **5100** | සේවක වැටුප් හා දීමනා ප්‍රතිපූර්ණය | 4,610,343.91 |
| පුනරාවර්තන ආදායම් | | **7,758,879.92** |

| වෙනත් ලැබීම් | | මුළු ලැබීම් |
|---|---|---|
| 7202 | වරිපනම් බදු | 3,500.00 |
| 7209 (i) | විවිධ තැම්පත් - ගොඩනැගිලි අයදුම්පත් නිර්. | 2,000.00 |
| 7209 (ii) | විවිධ තැම්පත් - විරීරේඛා හා නොපවරා ගැනීමේ සහතික | 13,000.00 |
| 7209(iii) | විවිධ තැම්පත් - අනුකූලතා සහතික | - |

| | | |
|---|---|---|
| 7209(iv) | විවිධ තැම්පත් - මිනින්දෝරු සහතික අනුමත කිරීම | 5,000.00 |
| 7209(v) | විවිධ තැම්පත් - දීර්ඝකාලීන පරික්ෂා කිරීම | 22,500.00 |
| 7209 (vi) | විවිධ තැම්පත් - මුද්දර බදු | 17,180.00 |
| 7209 (xii) | විවිධ තැම්පත් - කොඩි කණු | 12,000.00 |
| 3401 | උත්සව අත්තිකාරම් | 80,000.00 |
| 3402 | ආපදා ණය | 218,561.67 |
| 3404 | විශේෂ අත්තිකාරම් | 16,000.00 |
| 3218 | කර්මාන්ත ණයගැතියෝ | 579,854.69 |
| 7109 (i) | නිළධාරී අත්තිකාරම් | 40,895.00 |
| 1/7601 | ඉදිරියට ගෙවූ වරිපනම් | 1,298.44 |
| | | |
| **එකතුව** | | **1,011,789.80** |
| | | |
| **මුළු ලැබීම්** | | **8,770,669.72** |

| **2025** මැයි මස වියදම් සාරාංශය | | | |
|---|---|---|---|
| වැය සංකේත අංකය | වැය විස්තරය | මාසයේ වියදම | එකතුව |
| 1000 | වැටුප් හා වේතන | 6,119,106.93 | |
| 1100 | ගමන් ගාස්තු | 28,750.00 | |
| 1200 | සැපයුම් | 917,249.38 | |
| 1300 | අළුත්වැඩියා සහ නඩත්තු | 1,377,831.16 | |
| 1400 | පරිපාලන වියදම් | 571,663.23 | |
| 1500 | සුභසාධක ගෙවීම් | 48,650.00 | |
| 1600 | විවිධ ගෙවීම් | 70,992.90 | |
| 1700 | වෙනත් | - | |
| 1900 | මූල්‍ය පිරිවැය | 217,850.84 | |
| **පුනරාවර්තන වියදම්** | | | 9,352,094.44 |
| **වෙනත් ගෙවීම්** | | | |
| 3402 | ආපදා ණය | 1,910,717.72 | |
| 7102 | දේශීය ණය සංවර්ධන අරමුදල - ණය ප්‍රාග්ධනය | 330,735.67 | |
| 7209(ix) | විවිධ තැම්පත් | 21,200.00 | |
| 7311 | කර්මාන්ත ණයහිමි | 342,918.42 | |
| 7314 | වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් හිග ශේෂ කොටස් ගෙවීම් | 50,000.00 | |
| 3510 | සභා අරමුදල් ලංකා බැ. 3767059 (ගිණුම් අතර මාරු) | 673,680.46 | |
| 3511 | කර්මාන්ත ගිණුම (ගිණුම් අතර හුවමාරු ) | 1,341,035.44 | |
| 3518 | ගිණුම් අතර හුවමාරු- (Advanve B ) | 3,938.90 | |
| 7109 (i) | නිළධාරි අත්තිකාරම් | 50,000.00 | |
| 4-4207 | ආදායමින් ආපසු - යන්ත්‍ර කුලී ආපසු | 2,500.00 | |

| | | | |
|---|---|---|---|
| | ගෙවීම | | |
| 2102 | ගොඩනැගිලි ගිණුම | 1,790,498.43 | |
| 2109 | කාර්යාල උපකරණ | 170,250.00 | |
| 2106 | පිරියත | 60,372.50 | |
| 2112 | මාර්ග,පාලම් හා බෝක්කු | 146,839.23 | |
| | හබරණ පොදු වැසිකිළිය ඉතිරිවැඩ නිම කිරිම කර්මාන්තයේ කාර්ය සාධන ඇපකරය නිදහස් කිරිම | 173,317.00 | |
| එකතුව | | - | 7,068,003.77 |
| 2025 මැයි මස ගෙවීම් | | | 16,420,098.21 |

( උ ) රැස්වීම් කැඳවීමේ වෙනත් කාරණා කිසිවක් ඇත්නම් එම කරුණු එහි දක්වා ඇති අනු පිළිවෙලට හෝ විශේෂ හේතු නිසා ප්‍රාදේශිය සභාව විසින් තීරණය කරන අනුපිළිවෙලට

නැත

තවද මෙහිදි අදහස් දක්වමින් **ගරු සභික N.D.L.නිවුන්හැල්ල මහතා** විසින් පලුගස්වැව කොට්ඨාසයේ දරුවන් හට ක්‍රීඩා කිරිම සඳහා පහසුකම් නොමැති බැවින්, ක්‍රීඩා පිටියක අවශ්‍යතාවය දැඩිව පවතින බවත්, ඒ සඳහා අදාල ආයතන දැනුවත්කර අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.එමෙන්ම **ගරු සභික S.රෙජිනෝල්ඩ් මහතා** විසින් මේ දිනවල වීදි ලාම්පු අලුත්වැඩියා කටයුතු සිදු කරන බවත්, එය ඉතා හොඳින් සිදු කරන බැවින් , ඒ සඳහා ස්තූතිය පළ කරන ලදී. **ගරු සභික I.T.M.C.C.B.පොතුහැර මහතා** විසින් ප්‍රාදේශිය සභාව සතුව වත්කම් විශාල ප්‍රමාණයක් පවතින බැවින්,එම ඉඩම්වලින් නිසි ප්‍රයෝජනයක් ගෙන නොමැති බැවින්, එය සංවර්ධනය කර, සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරිමට කටයුතු කරන ලෙස බවසා සිටින ලදී.මේ සම්බන්ධව **ගරු සභාපති සිදත් චාමර බණ්ඩාර මුදියන්සේ මහතා** විසින් ගරු සභිකවරුන්විසින් ඉදිරිපත් කරන යෝජනා ලිඛිතව ලබා දීමට කටයුතු කිරිම සුදුසු බවත්, ඒ අනුව අදාල ආයතන දැනුවත් කිරිමට හැකි බැවින් , එය ලිඛිතව ලබා දීමට කටයුතු කරන ලෙස පවසා සිටින ලදී.

එමෙන්ම ඉදිරියේ දී සභාව මඟින් සිදු කරන කාර්යයන් සඳහා සියදලු දෙනාගේම සහයෝගය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින් , අද දින සභාවේ කටයුතු සිදු කිරිමට අවශ්‍ය සහය ලබා දුන් ලේකම්තුමිය ඇතුළු කාර්යය මණ්ඩලයට ද ස්තූතිය පුද කරමින් සභාවේ කටයුතු ප.ව. 2.30 පමණ නිමා කරන ලදී .

සකස් කළේ-
ලේකම්
2025.06.26
ප්‍රාදේශීය සභාව,
කැකිරාව.

සිදත් චාමර බංඩාර මුදියන්සේ,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
කැකිරාව.